# තිරසර සංවර්ධන ගම්මාන වැඩසටහන

## අනුරාධපුර දිස්ත්‍රික්කයේ අළුත් ගල්කිරියාගම ව්‍යාපෘති ප්‍රදේශය සඳහා වූ ඇගයීම් වාර්තාව


ආචාර්ය ඩී. තෙන්නකෝන්

එන්.එස්.ඩබ්. නවරත්න

කේ.ඩී.එස්. ආර්යසිංහ

ඊ.එන්.ආර්. ප්‍රනාන්දු



හෙක්ටර් කොබ්බැකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය

114 විජේරාම මාවත

කොළඹ 07

2003 දෙසැම්බර්



711.3
(SL)
හෙක්ට

2009/06 2010/04 225/-

# තිරසර සංවර්ධන ගම්මාන වැඩසටහන

## අනුරාධපුර දිස්ත්‍රික්කයේ අළුත් ගල්කිරියාගම ව්‍යාපෘති ප්‍රදේශය සඳහා වූ ඇගයීම් වාර්තාව

ආචාර්ය ඩී. තෙන්නකෝන්
එන්.එස්.ඩබ්. නවරත්න
කේ.ඩී.එස්. ආරියසිංහ
ර්.එන්.ආර්. ප්‍රනාන්දු

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය
114 විජේරාම මාවත
කොළඹ 07

2003 දෙසැම්බර්

MFN 8871
21452
21452
පුස්තකාලය LIBRARY

# පළමුවන පරිච්ඡේදය

## තිරසර සංවර්ධන ගම්මාන වැඩසටහන පිළිබඳ හැඳින්වීම.

### 1.1 පිවිසුම

ආර්ථික හා සමාජය වශයෙන් වඩා වැදගත් වූ මෙරට පාරිභෝගික කෘෂිකාර්මික ක්ෂේත්‍රය මෑතක සිට වඩාත් පසුගාමී හා අකාර්යක්ෂම එකක් බවට පත්ව ඇත. රටෙහි ජනගහණයෙන් 75% ක් පමණ ග්‍රාමීය අංශයෙහි ජීවත් වන අතර ශ්‍රම බලකායෙන් 35% ක් පමණ කෙළින් ම හෝ වක්‍ර අන්දමින් කෘෂිකර්මය හා සම්බන්ධ කටයුතුවල නියුතුව ජීවිකාව කරගෙන යති. මුළු ජනගහණයෙන් 70% ක් පමණ කෘෂිකර්මය මත යැපෙති. මෙතරම් වැදගත්කමක් දරනු ලබන දේශීය කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ මෑත භාගයේ දැකගත හැකි ප්‍රවණතා වන්නේ අඩු නිෂ්පාදන ඵලදායීතාවය, අඩු ආදායම්, වැඩි නිෂ්පාදන පිරිවැය, නිෂ්පාදන සඳහා ප්‍රමාණවත් මිලක් නො ලැබීම හා එය උච්චාවචනයට භාජනය වීම, රැකියා හිඟයක් පැවතිය දී වුව ද ජනතාව කෘෂිකර්මයෙන් තව තවත් බැහැර වීම යනාදිය යි. මේ තත්ත්වය ග්‍රාමීය ප්‍රදේශවල සමාජ ආර්ථික තත්ත්වය පහළ බැසීමටත්, දුප්පත්කම වර්ධනය වීමටත් හේතු වී ඇත.

නිදහස් ආර්ථික ප්‍රතිපත්තීන් යටතේ වර්තමාන ග්‍රාමීය ක්ෂේත්‍රය මුහුණ පා ඇති ඉහත දැක්වූ අභියෝග ජය ගැන්ම තුළින් සමෘද්ධිමත් ගොවි ජන සමාජයක් බිහි කිරීම සඳහා යොමු වූ නව ව්‍යාපෘතියක් හෙක්ටර් කොබ්බැකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය විසින් ආරම්භ කරනු ලැබ ඇති අතර එය "තිරසර සංවර්ධන ගම්මාන වැඩසටහන" වේ. මෙම වැඩසටහන කෘෂිකර්ම හා පශු සම්පත් අමාත්‍ය ගරු එස්.බී. දිසානායක ඇමතිතුමාගේ අදහසක් හා දිරිගැන්වීම මත ඇරඹීම සුවිශේෂ වූ කරුණකි.

### 1.2 තිරසර සංවර්ධන ගම්මාන වැඩසටහන

ඉහත දැක් වූ පරිදි විවිධාකාර වූ ප්‍රශ්න ග්‍රාමීය ක්ෂේත්‍රය තුළ පැවතිය ද ඒවා බොහොමයක් විසඳීම සඳහා අවශ්‍ය සම්පත් හා හැකියාවන් එම ක්ෂේත්‍රය තුළම පවතී. එවැනි දෑ හඳුනා ගැනීමත්, ඒවා විධිමත් පරිදි උපයෝගී කර ගැනීම සඳහා අවශ්‍ය තාක්ෂණික, කළමනාකරණ හා සංවිධානාත්මක විධි හා ක්‍රමෝපායයන් පිළිබඳව අත්හදා බැලීමක් සඳහා ආරම්භ කරනු ලැබූ පර්යේෂණ ව්‍යාපෘතිය "තිරසර සංවර්ධන ගම්මාන වැඩසටහන" වෙයි.

මෙම වැඩසටහන යටතේ දිවයිනේ විවිධ කෘෂි දේශගුණික කලාපයන්ගෙන් "ක්ෂේත්‍ර පර්යේෂණාගාර" ලෙස තෝරාගනු ලැබූ ගම් "ආදර්ශන" ගෙවත් "ආදර්ශ ගම්මාන" ලෙස දියුණු කිරීමට උත්සාහ ගනු ලැබින. එසේ කරනු ලැබුයේ එම ගම්වල කරනු ලැබූ විවිධ අත්හදා බැලීම් එම ගම් තුළම භාවිතයට සැලැස්වීමෙන් වූ අතර එවැනි ආදර්ශ ගම්මාන බිහි කිරීමේ අරමුණ වූයේ

අසල්වැසි අනෙකුත් ගම්වලටත් එවැනි සාර්ථක අත්දැකීම් අනුගමනය කිරීම තුළින් දියුණුව සලසා ගැනීමට අවස්ථාව ලබා දීම ය.

මෙම වැඩසටහනෙහි මූලික ලක්ෂණය වන්නේ ඒකාබද්ධ සංවර්ධනය, සහභාගිත්ව ප්‍රවේශය හා තිරසර භාවයයි. ග්‍රාමීය සංවර්ධනයේ දී බෝග හා නිෂ්පාදනවල විවිධාංගීකරණය, ආර්ථික කටයුතුවලට අමතරව අධ්‍යාපනය, සෞඛ්‍යය, යටිතල පහසුකම් ආදී වූ සමාජ හා අනෙකුත් අංශයන්හි සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීම, සංවර්ධනය සඳහා දායක කරගත හැකි සියළුම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලත්, ජනතාවගේත් සහභාගිත්වය හා සහයෝගය ඒ සඳහා උපරිම අන්දමින් ලබා ගැනීම හා පාරිසරික සමතුලිතතාවය මෙන්ම ආරම්භ කරනු ලබන ආර්ථික කටයුතු හා සංවිධානාත්මක ක්‍රමෝපායයන් ඇතුලත් සංවර්ධනාත්මක ක්‍රියාවලියෙහි දිගුකාලීන පැවැත්ම කෙරෙහි වැඩසටහන යටතේ විශේෂ අවධානය යොමු කිරීමට අපේක්ෂා කෙරින.

## 1.3. ව්‍යාපෘතියේ අරමුණු

මෙම ව්‍යාපෘතිය ප්‍රධාන අංග දෙකකින් සමන්විත වන අතර ඉන් ප්‍රධාන අංගය වන්නේ ඉහත දැක්වූ ආකාරයට ග්‍රාමීය සංවර්ධනය සඳහා කෙළින් ම හා ප්‍රායෝගිකව මැදිහත් වීම ය. ඒ යටතේ අනෙකුත් ගැමියන් පෙළඹවීම සඳහා විවිධ අත්හදා බැලීම් සිදු කරමින් ආදර්ශ ගම් බිහි කරනු ලැබේ. එහි දෙවන අංගය වන්නේ තොරතුරු සැපයීම තුළින් වක්‍ර අයුරින් ග්‍රාමීය සංවර්ධනය සඳහා දායක වීම ය. ඒ යටතේ කෘෂිකර්ම හා ග්‍රාමීය සංවර්ධනය සඳහා රජය අනුගමනය කරන්නා වූ ප්‍රතිපත්ති හා ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් කෙරෙහි ග්‍රාමීය ජනතාවගේ ආකල්ප හා ප්‍රතිචාරයන් සම්බන්ධ තොරතුරු එක්රැස් කර ඒ පිළිබඳව තීරණ ගන්නන් හා ප්‍රතිපත්ති සම්පාදකයින් දැනුවත් කිරීමට අපේක්ෂා කෙරෙනි.

ආදර්ශ ගම්මාන බිහි කිරීම තුළින් ග්‍රාමීය සංවර්ධනය සඳහා ප්‍රායෝගික ලෙස යොමු වූ මෙම වැඩසටහනෙහි මූලික අංගය දෙස බලන විට එහි දිගුකාලීන මෙන්ම කෙටිකාලීන අපේක්ෂාවන් ද ගැබ්ව පවතී. ඒවා නම්:

### 1.3.1 දිගු කාලීන බලාපොරොත්තු (අභිමතාර්ථ)

I. තිරසාර වූ නිෂ්පාදන ක්‍රියාවලියක් පදනම් කරගත් ආදර්ශ ගම්මාන බිහි කිරීම.

II. ජනතාවගේ ජීවන තත්ත්වය නැංවීම.

### 1.3.2 කෙටි කාලීන බලාපොරොත්තු (අරමුණු)

I. ජනතාවගේ ආදායම් වර්ධනය කිරීම.

II. රැකියා වර්ධනය කිරීම.

III. නිෂ්පාදන ඵලදායීතාවය වර්ධනය කිරීම.

IV. ආහාර සුරක්ෂිතභාවය තහවුරු කිරීම.

V. සංවර්ධනය සඳහා ජනතා සහභාගිත්වය උපරිම අයුරින් යොදා ගැනීම.

## 1.4 උපාය මාර්ග

ඉහත දැක්වූ අභිමතාර්ථ හා අරමුණු සඵල කර ගැනීම සඳහා විවිධ වූ ක්‍රමෝපායයන් අනුගමනය කිරීමට බලාපොරොත්තු වූ අතර ඒවා පහත සඳහන් වේ.

I. නිෂ්පාදන පිරිවැය අඩු කිරීම.

ගොවිපල නිෂ්පාදනයන්හි ආර්ථික ඵලදායී බව හා පවුලේ ආදායම් වර්ධනය සමග කෙළින්ම සම්බන්ධ වන මේ යටතේ ගොම, පිදුරු හා කොම්පෝස්ට් වැනි කාබනික ද්‍රව්‍ය භාවිතයට උනන්දු කරවීම මගින් රසායනික පොහොර භාවිතය අවම කිරීම හා එකවර වගා කිරීමට සැලැස්වීමෙන් ඒකාබද්ධ පළිබෝධ පාලනයට මග සලස්වා රසායනික ද්‍රව්‍ය භාවිතය සඳහා යන වියදම අවම කරවීම, අවශ්‍ය බීජ තම ගොවිපල හෝ ගම තුළින් ම නිපදවා ගැනීමට සලස්වා ඒ සඳහා යන අධික වියදම අඩු කිරීම යනාදිය ගැනේ.

II. නිෂ්පාදන සඳහා වඩා ඉහළ මිලක් ලබා ගැනීමට ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීම.

වෙළඳපොලෙහි වැඩි ඉල්ලුමක් ඇති බෝග හා කාබනික නිෂ්පාදනවලට උනන්දු කරවීම, වගා කාලසටහන වෙනස් කරවීම මගින් වැඩි මිලක් ලබාගත හැකි අවස්ථා වලදී නිෂ්පාදන වෙළඳපොලට දැමීමට කටයුතු සැලැස්වීම, වැඩි මිලක් ලැබෙන තෙක් අස්වනු ගබඩා කිරීම සඳහා උනන්දු කරවීම, ගොවීන් සංවිධානය කරවීම මගින් ඔවුන්ගේ කේවල් කිරීමේ ශක්තිය වර්ධනය කරවීම හා ඉදිරි වෙළඳ ගිවිසුම් අත්සන් කරවීමට සැලැස්වීම මගින් වඩාත් හොඳ මිලක් ලබා ගැනීම තහවුරු කරවීම යනාදී කාර්යයන් මෙයට ඇතුලත් ය.

III. නව තාක්ෂණික ක්‍රම හඳුන්වා දීම.

නිෂ්පාදන ඵලදායීතාවය වැඩි කිරීම සඳහා ඉවහල් වන නව බීජ, යෙදවුම් හා භාවිතයන් මෙන්ම නව යන්ත්‍ර සූත්‍ර හඳුන්වා දීම සහ උචිත භාවය අනුව ඒවා යොදා ගැනීමට ගොවීන් උනන්දු කරවීම මේ යටතට ඇතුලත් ය.

IV. සම්පත් කාර්යක්ෂමව හා ඵලදායී භාවිතය

ගොවිපල මට්ටමේ ඵලදායීතාව හා ආදායම නැංවීමට හේතු කරවන බෝග විවිධාංගීකරණය මෙන්ම යටි වගාව, මිශ්‍ර වගාව යනාදිය සඳහා ගොවීන් උනන්දු කරවීම, බෝග

වගාව හා සත්ව පාලනය ඒකාබද්ධ කිරීමට මග සැලැස්වීම හා දැනට භාවිතයට නොගත් ඉඩම්, ජලය ඇතුළු ස්වභාවික සම්පත් ප්‍රයෝජනයට යොදා ගැන්මට සැලැස්වීම මේ යටතේ ගැනේ.

V. නිෂ්පාදන තීව්‍රතාවය වැඩි කිරීම

ජල කළමනාකරණය කෙරෙහි ගොවීන් උනන්දු කරවීම හා විසිදුම් හා බිංදු ජල සම්පාදනය වැනි සූක්ෂම ජල සම්පාදන ක්‍රම හඳුන්වා දීම මගින් ජලය ඉතිරි කර ගැනීමට සලස්වා අමතර කන්නයක් වගා කිරීමට මග පෙන්වා දීම මේ යටතට ගැනෙන අතර කාර්යක්ෂම ලෙස සම්පත් භාවිතයට මෙන්ම ආදායම් වර්ධනයටත් මේවා හේතු වේ.

VI. කෘෂි කර්මාන්ත මෙන්ම වෙනත් කර්මාන්ත හා ස්වයං රැකියා බිහි කිරීම.

සංවර්ධනයේ විවිධාංගීකරණයට මෙන්ම ගොවි පවුල්වල රැකියා හා ආදායම් වර්ධනයට ඉවහල් වන මේ සඳහා කෘෂි සම්පත් මෙන්ම වෙනත් වටපිටාවේ ඇති සම්පත් භාවිතයෙන් ඇරඹිය හැකි කර්මාන්ත හා වෙනත් ආදායම් මාර්ග ඇරඹීමට කැමති අයට අදාල පුහුණු අවස්ථා ලබාදීම හා අවශ්‍ය පහසුකම්, උපදෙස්, අලෙවි මාර්ග යනාදිය ලබා ගැනීමට අදාල ආයතන සමග සාකච්ඡා කර මග සැලැස්වීම ඇතුලත් ය.

VII. අරපරෙස්සම, ඉතුරුම් වර්ධනය හා ආයෝජනය සඳහා ජනතාව පෙළඹවීම.

ජනතාවගේ ආකල්පමය වෙනසක් ඇති කිරීම තුලින් බීමත්කම ආදී අනවශ්‍ය වියදම් අඩු කිරීමත් සමෘද්ධි, ගොවිජන බැංකු, ග්‍රාමීය බැංකු ආදී බැංකු සමඟ වැඩි සබඳතාවක් ගොඩ නංවාලීම තුලින් ඉතිරි කිරීම් සඳහා මෙන්ම ආපසු ගෙවීම සඳහා ඔවුන් තුළ නැඹුරුවක් ඇති කිරීමත් එමගින් පහසුවෙන් ණය ලබා ගත හැකි අය බවටත්, අනාගත ආයෝජකයින් බවටත් පත් වීමට ඇති ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීම.

VIII. පුනරුත්ථාපන හා ඉදිකිරීම් කටයුතු සිදු කිරීම

ආර්ථික හා සමාජ සංවර්ධනය ඇති කිරීමට හේතු වන්නා වූ කැඩී බිඳී ගිය හා ගොඩ වූ වැව්, අමුණු හා ඇලවේලි පුනරුත්ථාපනය, මාර්ග අළුත්වැඩියා කිරීම යනාදියත් කෘෂි ළිං ඇල මාර්ග, පාලම්. බෝක්කු හා ගොඩනැගිලි යනාදිය අළුතෙන් ඉදි කිරීමත් මේ යටතට ගැනේ.

IX. පාරිසරික සමතුලිතතාවය ආරක්ෂා කිරීම.

කෘෂි ඉඩම්වල පස සංරක්ෂණ සඳහා කානු, වැටි ආදිය දැමීමට සැලැස්වීම, වැව් හා ජලාශයන්ට අදාල ජලධාර ප්‍රදේශ හා රක්ෂිතයන් හි වන වගා සඳහා උනන්දු කරවීම, පාරවල් දෙපස හා පොදු ඉඩම් යනාදියේ වන වගා කරවීම හා පෞද්ගලික ඉඩම්වල කෘෂි වන වගාවන්

සඳහා උනන්දු කරවීම, ඊට අවශ්‍ය පහසුකම් සැලැස්වීම යනාදිය මේ යටතේ සිදු කෙරෙන අතර පස මෙන්ම ජල සංරක්ෂණය කෙරෙහිත් කෘෂි නිෂ්පාදනයන්හි තිරසාරත්වය කෙරෙහිත් මේවා බලපානු ලැබේ.

X. සහභාගිත්ව විධි ක්‍රම අනුගමනය හා ග්‍රාමීය සංවිධාන බිහි කිරීම.

සම්පත් හා ගැටළු හඳුනා ගැනීමේ සිට ඒවාට විසඳුම් ලබා ගැනීම සඳහා සැලසුම් සකස් කර ක්‍රියාත්මක කරවීම, ප්‍රගති සමාලෝචනය, පසු විපරම ආදී වූ සංවර්ධනයේ හැම අවස්ථාවකදී ම ග්‍රාමීය ජනතාවගේ උපරිම දායකත්වය ලබා ගැනීම සඳහා අවශ්‍ය සංවිධාන ව්‍යුහයන් ගම තුළ බිහි කිරීම, සංවර්ධන කටයුතු හා සම්බන්ධ තීරණ ගැනීමේ දී ජනතාව සම්බන්ධ කර ගැනීම හා ඔවුන්ගේ ගැටළු යනාදිය හඳුනා ගැනීම සඳහා සහභාගිත්ව ගැමි විමසුම් ක්‍රමය වැනි සහභාගිත්ව විධි ක්‍රමයන් අනුගමනය කිරීම.

XI. ප්‍රදේශයේ රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන ආයතන ගම වෙත වඩාත් සමීප කරවීම.

කෘෂි උපදෙස් ඇතුළු සෙසු තාක්ෂණ හා විවිධ සේවාවන් සපයනු ලබන ග්‍රාමීය ආයතන ගමත් සමග වඩාත් සමීප කරවීම හා ඒ සඳහා ගම තුළ පිහිටුවන ආයතනික රාමුව උපයෝගී කර ගැනීමට කටයුතු කිරීම.

XII. නව අත්හදා බැලීම සිදු කිරීම

වෙනත් ප්‍රදේශවලින් දැක ගත හැකි සාර්ථක සංවර්ධන අත්දැකීම් පදනම් කර ගනිමින් විවිධ නිෂ්පාදන, යෙදවුම්, තාක්ෂණික භාවිතයන් සංවිධානාත්මක හා කළමනාකරණ විධි ක්‍රමයන් පිළිබඳ අත්හදා බැලීම් සිදු කිරීම.

1.5 ක්‍රියා මාර්ග

ඉහත සඳහන් කරනු ලැබූ විවිධ සංවර්ධන ක්‍රමෝපායන් යටතේ ගනු ලබන ක්‍රියා මාර්ග අදාල ව්‍යාපෘති ප්‍රදේශයන්හි පවත්නා ප්‍රශ්නවල ස්වභාවය හා සම්පත් යනාදිය අනුවත් ඒවායෙහි ඇති උචිත භාවය මෙන්ම ඒ සඳහා ජනතාව දක්වනු ලබන උවමනාව හා ප්‍රමුඛත්වය මතත් තීරණය කෙරේ.

1.6 යෙදවුම්

මෙම ව්‍යාපෘතිය සඳහා භාවිත මූලික යෙදවුම් වන්නේ නව බීජ වර්ග, පැල වර්ග, සතුන් වර්ග, තාක්ෂණික උපකරණ, ව්‍යාප්ති සේවා දැනුම හා උපදේශන සේවා, විශේෂඥ ඥානය, මුදල් යනාදිය වෙති.

පුස්තකාලය LIBRARY

මේවා බොහොමයක් එම ගම් ප්‍රදේශයන්හි අදාල ආයතන මගින් ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන් යටතේ ලබා දෙනු ලබන ඒවා වන අතර ව්‍යාපෘතිය යටතේ ඒවා ජනතාව වෙත ක්‍රමවත් හා වඩාත් ඵලදායී වන ආකාරයෙන් බෙදා හැරීමට කටයුතු සැලසේ. ඊට අමතරව ව්‍යාපෘතිය සඳහා වෙන් කර ඇති මුදල් මගින් ද බීජ හා පැල වර්ග යම්කිසි ප්‍රමාණයක් ජනතාව වෙත ලබා දීමට කටයුතු කෙරේ.

## 1.7 නිමවුම්

වැඩසටහනින් අපේක්ෂිත නිමවුම් වන්නේ විවිධ වගාවන් යටතේ ඇති වපසරිය හා යටි වගාව, මිශ්‍ර වගාව හා නව තාක්ෂණික ක්‍රම භාවිත වපසරිය වැඩිවීම, ස්වයං රැකියා ඒකක වැඩිවීම, නිෂ්පාදනය වැඩිවීම යනාදියයි.

## 1.8 සම්බන්ධීකරණය

මෙම අධ්‍යයනය හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය විසින් සම්බන්ධීකරණය කරනු ලබන අතර කෘෂිකර්ම හා පශු සම්පත් හා සමෘද්ධි අමාත්‍යාංශය මෙන්ම සෙසු අමාත්‍යාංශවලට අයත් දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල හා අදාල ප්‍රදේශවල පිහිටි රාජ්‍ය නොවන ආයතනවල සහයෝගයෙන් ක්‍රියාත්මක කෙරේ.

## 1.9 මූල්‍ය පහසුකම් සැපයීම

වැඩසටහන සම්බන්ධීකරණය කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීම සිදු කරනු ලබන්නේ සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවට අයත් සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදල මගිනි. මේ සඳහා රු. දශ ලක්ෂ 4.3 ක මුදලක් ලබා දී තිබේ.

මීට අමතරව ඇතැම් ගම්වල ඉදිකිරීම් කටයුතු සඳහා ද එමගින් මුදල් වැය කර ඇත. එම ප්‍රමාණය රු. දශ ලක්ෂ 0.7 කි. මීට අමතරව කෘෂිකර්ම හා පශු සම්පත් අමාත්‍යාංශය රු. දශ ලක්ෂ 10 ක මුදලක් වැව් හා ප්‍රවාහන පද්ධතීන් පුනරුත්ථාපනය හා කෘෂි ළිං ඉදිකිරීම ඇතුලත් පාදක ව්‍යුහය දියුණු කිරීමට ලබා දී ඇත.

## 1.10 ව්‍යාපෘති ප්‍රදේශ තෝරා ගැනීම

ව්‍යාපෘති ප්‍රදේශ තෝරා ගැනීමේ දී විවිධ කෘෂි දේශගුණික කලාපයන් මෙන්ම (වී, අර්තාපල්, ලොකු ලූනු, මිරිස්, උඩරට එළවළු, මුං ඇට/කව්පි වැනි) විවිධ බෝග හා (සත්ව පාලනය වැනි) ආර්ථික කටයුතු නියෝජනය වන ආකාරයට කටයුතු කර ඇත. ඒ අනුව (උතුරු මැද ඌව, මධ්‍යම, වයඹ ආදී) පළාත් 4 ක් හා (පොළොන්නරුව, මොණරාගල, බදුල්ල, කුරුණෑගල,

මාතලේ, අනුරාධපුරය, නුවරඑළිය, පුත්තලම යනාදී) දිස්ත්‍රික්ක 8 ක් නියෝජනය වන ආකාරයෙන් ග්‍රාමසේවා වසම් 9 ක් තෝරාගෙන ඇත. එසේ තෝරාගත් ගම් හා අදාල විස්තර ඇමුණුම 1 හි ඇති අංක 1 වගුවෙහි සඳහන් වේ.

1.11 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ ආයතනයේ කාර්යභාරය.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් 2002 වසරේ අවසාන කාර්තුව තුලත් 2003 වසර මුළුල්ලේත් හෙ.කො.ගො.ප.පු.ආයතනයේ සම්පූර්ණ ශක්තිය හා කැපවීම සිදු කර ඇත. මේ වෙනුවෙන් ආයතනයේ සියළුම අංශයන් හි සිටින පර්යේෂණ නිලධාරීන් මෙන්ම පර්යේෂණ සහාය කාර්ය මණ්ඩලයත් මහත් පරිශ්‍රමයක් දරා ඇත. ඒ අනුව ඒ ඒ ව්‍යාපෘති ගම්මාන යටතේ ඇති සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා (සම්බන්ධීකරණ නිලධාරියෙකු/නිලධාරිනියක ලෙස) පර්යේෂණ නිලධාරියෙකු/නිලධාරිනියක බැගින් පත් කර ඇත. ඔහුගේ හෝ ඇයගේ සහායට තවත් පර්යේෂකයකු පත් කර සිටී. මීට අමතරව ඒ ඒ ව්‍යාපෘති ගම්වල සිදු කරනු ලබන සංවර්ධන කටයුතු සඳහා සහාය වීමට සංඛ්‍යාන නිලධාරී හා සංඛ්‍යාන සහකාරවරුන් එක් අයෙකු හෝ දෙදෙනෙකු පත් කර සිටිති. සියළුම ගම්මාන හෙවත් උප ව්‍යාපෘතීන් ඇතුලත් මුළු වැඩසටහනම සම්බන්ධීකරණය කිරීම කෘෂි ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශයෙන් සිදු කරනු ලබන අතර ඒ සඳහා එක් සම්බන්ධීකරණ නිලධාරියෙකු පත් කර සිටී. ආයතනයේ අධ්‍යක්ෂ තුමා සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ තුමා උපදෙස් සැපයීමෙන් එය ක්‍රියාත්මක කිරීම සඳහා සහාය දක්වති. මෙම ව්‍යාපෘතිය හා ඒ යටතේ ඇති උප ව්‍යාපෘතීන් (ව්‍යාපෘති ගම්) සම්බන්ධයෙන් විවිධ වගකීම් කරනු ලබන නිලධාරීන්/නිලධාරිනියන්ගේ නම් ඇමුණුම 1 යටතේ ඇති අංක 2 වගුව මගින් ඉදිරිපත් කර ඇත.

1.12 මෙම අගැයීම් අධ්‍යයන වාර්තාව

මෙම වාර්තාවෙන් හෙළි දැක්වෙන්නේ තිරසර වැඩසටහනෙහි එක් ව්‍යාපෘති ප්‍රදේශයක් වූ අනුරාධපුර දිස්ත්‍රික්කයේ අළුත් ගල්කිරියාගම ග්‍රාම නිලධාරී වසම පදනම් කර ගනිමින් ක්‍රියාත්මක කළ සංවර්ධන කටයුතු ඇගයුමට භාජනය කිරීම තුලින් ලබාගත් තොරතුරු ය. අදාල ව්‍යාපෘති ප්‍රදේශයේ මූලික සමාජ ආර්ථික ලක්ෂණ, සම්පත්, ප්‍රශ්න හා ගැටළු යනාදියත්, ව්‍යාපෘතිය යටතේ එහි ක්‍රියාත්මක කරන ලද කටයුතුත්, ඒවායේ ප්‍රතිඵල හා අපේක්ෂිත ව්‍යාපෘති අරමුණු කරා ළඟා වීම සඳහා ඒවා කොතරම් දුරට උපකාර වූවා ද යන්නත්, ව්‍යාපෘතියට මුහුණදීමට සිදු වූ ගැටළු යනාදියත්, එය ක්‍රියාත්මක කිරීමෙන් ලබාගත් පාඩම් හා අත්දැකීම් යනාදියත් මෙමගින් ඉදිරිපත් කෙරේ.

පොතානේගම ව්‍යාපෘති බල ප්‍රදේශයේ පහළ සියඹලෑව සහ පොතානේගම යන ප්‍රධාන කොටස් දෙක සඳහා වෙන වෙනම සමීක්ෂණ තොරතුරු ලබා ගන්නා ලද අතර අදාල වගු පිළියෙල කර ඇත්තේ ඒ අනුව ය.

## 1.13 ක්‍රමවේදය

මෙම වාර්තාව සැකසීමේ දී අදාල ව්‍යාපෘති ප්‍රදේශය පදනම් කර ගනිමින් සකසා ඇති පාදක සමීක්ෂණ වාර්තාව, එහි වාසය කරන ජනතාව සම්බන්ධ කර ගනිමින් සිදු කරනු ලැබූ සහභාගිත්වය ගැමි විමසුම් අභ්‍යාසය, ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වගකීම් දැරූ නිලධාරීන් විවිධ අවස්ථාවන්හි දී ගම වෙත පිවිසීමේ දී කරනු ලැබූ නිරීක්ෂණ හා ව්‍යාපෘතියෙහි විවිධ අත්දැකීම් පදනම් කර ගනිමින් වරින් වර සකස් කරනු ලැබූ ප්‍රගති වාර්තා යනාදිය පදනම් කර ගනු ලැබීන.

# දෙවන පරිච්ඡේදය .

## ව්‍යාපෘති ප්‍රදේශයේ සමාජ ආර්ථික තත්ත්වය

මෙම පරිච්ඡේදයේදී අලුත් ගල්කිරියාගම තිරසාර සංවර්ධන ගම්මාන ව්‍යාපෘති බල ප්‍රදේශයේ සමාජ ආර්ථික තත්ත්වය විග්‍රහ කෙරේ. අධ්‍යයන ප්‍රදේශයේ ජනගහණ ලක්ෂණ ප්‍රධාන හා ද්විතීය ආර්ථික කටයුතු හා ජනතාවගේ ජීවන තත්ත්වය හා සම්බන්ධ සෞඛ්‍ය හා නිවාස තත්ත්වයන් මෙම විග්‍රහයට ඇතුලත්වේ.

## 2.1 පිහිටීම.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහවැලි H කලාපයට අයත් ගල්කිරියාගම කොට්ඨාශ කලමණාකරණ බල ප්‍රදේශයේ අළුත් ගල්කිරියාගම ග්‍රාම නිලධාරී වසම පිහිටා ඇත. ගල්කිරියාගම නගරයේ සිට ගලේවෙල - කලාවැව මාර්ගයේ පිහිටි මී වැව මංසන්දියට දිවෙන මාර්ගයේ කි.මී. 1 ක් දුරින් පිහිටි මෙම ගම්මානයට කෘෂි කාර්මික කටයුතු සඳහා මහවැලි දියවර සපයනුයේ ඉබ්බනකටුව ජලාශයේ සිට රණව වැව හරහා වේ. බලලු වැවට හා බලලු වැව රක්ෂිත වන ගහණයට ගම්මානයේ උතුරු කෙළවර මායිම් වී පිහිටීම නිසා දර්ශනීය ගම්මානයක් ලෙස මෙම ගම්මානය හැඳින්විය හැකිය. මෙම වන රක්ෂිතයේ අලි ඇතුන් නිතර ගැවසීම කලා වැවේ හා බලලු වැවේ ස්වභාව සෞන්දර්යය තීව්‍ර කිරීමට හේතු වුවද මෙම ගම්මානයේ ගොවීන්ට නම් එය විශාල වශයෙන් පීඩා ගෙන දෙන කාරණයක් බවට පත්ව ඇත. මහවැලි සංවර්ධන කටයුතු යටතේ ගල්කිරියාගම නව ග්‍රාමීය සේවා මධ්‍යස්ථානයක් ලෙස දියුණු කර තිබීමත් නිසා සෞඛ්‍ය, අධ්‍යයනය හා වෙළඳ පොල වැනි මූලික අවශ්‍යතා සඳහා මෙම ගම්මානයට පහසු පිවිසුමක් තිබේ.

## 2.2 ඓතිහාසික තත්ත්වය

මහවැලි ජනාවාස පිහිටුවීමට පෙර මෙම ප්‍රදේශයේ කුඩා වැව් ආශ්‍රිතව සම්ප්‍රදායික ගම්මාන රාශියක් පිහිටා තිබිණි. මහවැලි කඩිනම් ව්‍යාපාරය මගින් ප්‍රථමයෙන්ම ජනාවාස කරණය කරන ලද මහවැලි H කලාපයට අයත් මෙම ගම්මානය ජනාවාසයක් බවට පත්වූයේ 1978 දීය. ජනාවාස කරණය වී වසර 25 ක් ඉක්මවා ගොස් ඇති අතර මේ වන විට දෙවන පරම්පරාවක් බිහිවී ඇත. මේ නිසා වසර 25 කට පෙර ජනාවාස ඇතිකරණ අවධියේ තිබූ මූලික සමාජ ආර්ථික ලක්ෂණයන්ගේ පැහැදිලි වෙනස් වීමක් සිදුවීඇති බව පැහැදිලිවම දැකිය හැකිය. ජනගහණය දෙගුණයකින් වැඩිවී ඇති අතර ඉඩම් කැබලි වීම අයහපත් ලෙස බලපා ඇත.

## 2.3 ජනගහනය හා එහි ලක්ෂණ

ප්‍රදේශයේ මූලික ජනගහන ලක්ෂණ වයස් කාණ්ඩ අනුව වගු අංක 2.1 න් පැහැදිලිව පෙන්වයි.

වගු අංක 2.1

| වයස් කාණ්ඩය | පිරිමි | % | ගැහැණු | % | එකතුව | % |
|---|---|---|---|---|---|---|
| 0-5 | 9 | 4.6 | 10 | 5.4 | 19 | 5.0 |
| 6-10 | 12 | 6.2 | 10 | 5.4 | 22 | 5.8 |
| 11-14 | 12 | 6.2 | 5 | 2.7 | 17 | 4.5 |
| 15-64 | 152 | 77.9 | 148 | 80.4 | 300 | 79.2 |
| 64-80 | 10 | 5.1 | 11 | 6.0 | 21 | 5.5 |
| **එකතුව** | **195** | **100.0** | **184** | **100.0** | **379** | **100.0** |

මෙම ගම්මානයේ ආරම්භක ජනපද ගොවි පවුල් ගණන 123 කි. මේ වන විට එම පවුල් සංඛ්‍යාව 240 දක්වා ඉහළ යාමක් සිදුවී ඇත. මුළු ජන ගහණය 831 කි. එයින් 413 ක් පුරුෂ වන අතර 418 ක් ස්ත්‍රී වේ. සමස්ථ ජන සංඛ්‍යාවම සිංහල වන අතර ආගමික වශයෙන් බෞද්ධයන් වේ. ජනගහණය පසුගිය වසර 25 තුල දෙගුනවී ඇති අතර එම අනුපාතයට වයස් ඛාණ්ඩ අතර ව්‍යාප්තියේද වෙනස්කම් සිදුවී ඇත. ශ්‍රම බලකාය එනම් අවුරුදු 15-64 වයස් කාණ්ඩය තුල පසුවන ජන සංඛ්‍යාව 79% කි. මිනිස් ශ්‍රමය බහුල වශයෙන් අවශ්‍ය කෘෂි කාර්මික ප්‍රදේශයක් වන අළුත් ගල්කිරියාගම ගම්මානයට මෙය වාසිදායක තත්ත්වයක් ලෙස දැක්විය හැකිය. වැඩිහිටි ජනගහණය 5.5% ක් වන අතර ළදරු හා ළමා ජන සංඛ්‍යාව 15.5% කි. ජන සංඛ්‍යාවේ මධ්‍යනය වයස අවුරුදු 36.48 කි.

### 2.3.1 විවාහක / අවිවාහක තත්ත්වය

අධ්‍යයන ප්‍රදේශයේ විවාහක අවිවාහක තත්ත්වය වගු අංක 2.2 න් දක්වා තිබේ.

වගු අංක 2.2

| විවාහක/අවිවාහක තත්ත්වය | පිරිමි | % | ගැහැණු | % | එකතුව | % |
|---|---|---|---|---|---|---|
| විවාහක | 94 | 48.21 | 99 | 53.80 | 193 | 50.92 |
| අවිවාහක | 99 | 50.77 | 67 | 36.41 | 166 | 43.80 |
| වැන්දඹු | 2 | 1.03 | 15 | 8.15 | 17 | 4.49 |
| දික්කසාද | 0 | 0 | 1 | 0.54 | 1 | 0.26 |
| වෙනත් | 0 | 0 | 2 | 1.09 | 2 | 0.53 |
| **එකතුව** | **195** | **100.0** | **184** | **100.0** | **379** | **100.0** |

මුළු ජන සංඛ්‍යාවෙන් 51% ක් විවාහක වන අතර අවිවාහක සංඛ්‍යාව 44% කි. වැන්දඹු, දික්කසාද හා වෙන්ව ජීවත්වන ජන සංඛ්‍යාව 5% ක් පමණ වේ. එමගින් පෙන්නුම් කරනුයේ පවුල් සම්බන්ධතා යහපත් තත්ත්වයක පවතින බවයි.

## 2.4 ආර්ථික කටයුතු හා එහි විශේෂිත ලක්ෂණ

ශ්‍රම බලකායේ ක්‍රියාකාරී හා අක්‍රියාකාරී ව්‍යුහය වගු අංක 2.3 න් පැහැදිලිව පෙන්වයි.

වගු අංක 2.3

| ස්වභාවය | පිරිමි | % | ගැහැණු | % | එකතුව | % |
|---|---|---|---|---|---|---|
| රැකියා කරන | 127 | 65.13 | 71 | 38.59 | 198 | 52.24 |
| රැකියා අපේක්ෂිත | 9 | 4.62 | 18 | 9.78 | 27 | 7.12 |
| ශිෂ්‍ය | 37 | 18.97 | 27 | 14.67 | 64 | 16.89 |
| ගෘහ කටයුතු | 0 | 0 | 40 | 21.74 | 40 | 10.55 |
| මහළු/ආබාධිත | 9 | 4.62 | 10 | 5.43 | 19 | 5.01 |
| වෙනත් | 0 | 0 | 1 | 0.54 | 1 | 0.26 |
| වාර්තා කර නැති | 13 | 6.67 | 17 | 9.24 | 30 | 7.92 |
| **එකතුව** | **195** | **100.0** | **184** | **100.0** | **379** | **100.0** |

මුළු ජන සංඛ්‍යාවෙන් 52% ක් රැකියාවක නිරත වී ඇත. පිරිමි ජන සංඛ්‍යාවෙන් 65% ක් ද ගැහැණු සංඛ්‍යාවෙන් 39 % ක් ද ආදායම් උපදවන කාර්යයක නියුතුව සිටී. අධ්‍යාපනය හදාරමින් සිටිනවුන්ගේ ප්‍රතිශතය 17 % ක් වන අතර රැකියා අපේක්ෂිතයන්ගේ සංඛ්‍යාව 7% කි. වයස 25ට අඩු තරුණ වයසේ අය අතුරින් රැකියා අපේක්ෂිත සංඛ්‍යාව නියෝජනය වී ඇති බව විශේෂ ලක්ෂණයකි.

### 2.4.1 ප්‍රධාන ආර්ථික කටයුතු

අධ්‍යයන ප්‍රදේශයේ රැකියා නියුක්තිකයින් රැකියා වර්ග අනුව ව්‍යාප්ත වී ඇති ආකාරය වගු අංක 2.4 න් දක්වා තිබේ.

**වගු අංක 2.4**

| රැකියාව | පිරිමි | % | ගැහැණු | % | එකතුව | % |
|---|---|---|---|---|---|---|
| ගොවිතැන | 89 | 45.64 | 39 | 21.20 | 128 | 33.77 |
| කෘෂි කම්කරු | 1 | 0.51 | 2 | 1.09 | 3 | 0.79 |
| රජයේ රැකියාවක නියුතු | 26 | 13.33 | 12 | 6.52 | 38 | 10.03 |
| පුද්ගලික රැකියාවක නියුතු | 5 | 2.56 | 1 | 0.54 | 6 | 1.58 |
| ව්‍යාපාරික | 3 | 1.54 | 1 | 0.54 | 4 | 1.06 |
| පුහුණු ශ්‍රමික | 1 | 0.51 | 1 | 0.54 | 2 | 0.53 |
| විදේශීය රැකියාකරන | 1 | 0.51 | 15 | 8.15 | 16 | 4.22 |
| කෘෂි සහායක | 1 | 0.51 | 15 | 8.15 | 16 | 4.22 |
| රියැදුරු | 1 | 0.51 | 0 | 0 | 1 | 0.26 |
| රජයේ විශ්‍රාමික | 1 | 0.51 | 1 | 0.54 | 2 | 0.53 |
| වාර්තාකර නැති | 66 | 33.85 | 97 | 52.72 | 163 | 43.01 |
| **එකතුව** | **195** | **100.0** | **184** | **100.0** | **379** | **100.0** |

පිරිමි ජන සංඛ්‍යාවෙන් 46% ක් හා ගැහැණු ජන සංඛ්‍යාවෙන් 34% ක් කෘෂිකාර්මික කටයුතු වල නියැලී සිටී. රජයේ රැකියාවල නියුතු සංඛ්‍යාව 10% ක් වන අතර එයින් බහුතරය ආරක්ෂක අංශවල සේවය කරන්නන් වේ. පෞද්ගලික අංශයේ රැකියා කරනු ලබන ජන සංඛ්‍යාව 2% ටත් පහල මට්ටමක පවතී.

විවෘත ආර්ථික ක්‍රමයක් පවතින ශ්‍රී ලංකාවේ අනෙකුත් ප්‍රදේශ හා සසඳන කල මෙම ප්‍රතිශතය ඉතා පහල මට්ටමක විය හැකිය. අනෙකුත් රැකියා පිළිබඳව සලකන විට වඩාත් වැදගත් වන්නේ කාන්තාවන්ගෙන් 4% කට වැඩි සංඛ්‍යාවක් විදේශ රැකියා සඳහා යොමු වීමයි. සත්ව පාලනය ස්වයං රැකියා හා කර්මාන්ත සඳහා යොමු වී ඇති සංඛ්‍යාව සැලකිය යුතු තත්ත්වයක නොමැත.

### 2.4.1.2 ද්විතියික ආර්ථික කටයුතු

මුළු ජන සංඛ්‍යාවෙන් 17% ක් ද්විතික රැකියා වල නිරත වී ඇත. රැකියා බාණ්ඩ අනුව ද්විතික රැකියා වල නියුක්තිකයන්ගේ ව්‍යාප්තිය වගු අංක 2.5 න් පැහැදිලිව දක්වා ඇත.

වගු අංක 2.5

| රැකියාව | පිරිමි | % | ගැහැණු | % | එකතුව | % |
|---|---|---|---|---|---|---|
| ගොවිතැන | 15 | 7.69 | 11 | 5.98 | 26 | 6.86 |
| කෘෂි කම්කරු | 14 | 7.18 | 0 | 0 | 14 | 3.69 |
| කෘෂි නොවන කම්කරු | 2 | 1.03 | 0 | 0 | 2 | 0.53 |
| රජයේ රැකියාවක නියුතු | 0 | 0 | 2 | 1.09 | 2 | 0.53 |
| පුද්ගලික රැකියාවක නියුතු | 1 | 0.51 | 0 | 0 | 2 | 0.26 |
| ව්‍යාපාරික | 8 | 4.10 | 1 | 0.54 | 19 | 2.37 |
| පුහුණු ශ්‍රමික | 3 | 1.54 | 0 | 0 | 3 | 0.79 |
| ගොවිපල සහායක | 0 | 0 | 3 | 1.63 | 3 | 0.79 |
| රියැදුරු | 2 | 1.03 | 0 | 0 | 2 | 0.53 |
| ගඩොල් සෑදීම | 1 | 0.51 | 0 | 0 | 1 | 0.26 |
| දේශීය වෙදකම | 1 | 0.51 | 0 | 0 | 1 | 0.26 |
| ළදරු පාසැල් ගුරු | 0 | 0.51 | 1 | 0.54 | 1 | 0.26 |
| වාර්තාකර නැති | 148 | 75.90 | 166 | 90.22 | 314 | 82.85 |
| **එකතුව** | **195** | **100.0** | **184** | **100.0** | **379** | **100.0** |

මුළු ජන සංඛ්‍යාවෙන් 83% ක්ම ද්විතියික රැකියා නොකරනු ලබයි. ද්විතියික රැකියාව වශයෙන් කෘෂිකාර්මික කටයුතුවල යෙදී සිටින ජන සංඛ්‍යාව 7% ක් පමණ වන අතර කෘෂි කාර්මික කම්කරුවන් වශයෙන් යෙදී සිටින සංඛ්‍යාව 4% කි.

පුස්තකාලය
LIBRARY
ගොවිජන ... ප.පු ආ
HARTI

21452

### 2.4.2 රැකියා වියුක්තිය

වගු අංක 2.3 මගින් පැහැදිලි වී ඇති ආකාරය අනුව රැකියා අපේක්ෂිතයන්ගේ සංඛ්‍යාව 7% කි. රැකියා වියුක්තිය 7% ක් වීම ශ්‍රී ලංකාවේ රැකියා වියුක්තිය හා සසඳන විට යහපත් තත්ත්වයක් ලෙස සැලකිය හැකිය. රැකියා වියුක්තිය පහල මට්ටමක පැවතීමට හේතුව කෘෂිකාර්මික කටයුතු සඳහා දෙවන පරම්පරාවද යොමුවීමයි.

### 2.4.3 ඉඩම් අයිතිය බුක්තිය හා ඉඩම් ආශ්‍රිත ගැටළු

ඉඩම් අයිතිය පිළිබඳව සලකන කල 92% කටම තමන්ට අයිතිය හිමිව ඇත. මෙම ප්‍රදේශයේ ජනපද ඉඩම්වල වපසරිය වන්නේ කුඹුරු බිම් අක්කර 2.5 ක් හා ගොඩ ඉඩම් අක්කර 1/2 කි. දෙවන පරම්පරාව සඳහා මෙම ප්‍රමාණය ප්‍රමාණවත් නොවන හෙයින් මේ වන විට ඉඩම් ආශ්‍රිත ගැටළු මතුවී ඇත.

වගු අංක 2.6

| ඉඩම් අයිතිය | ගෙදර ගෙවත්ත | | පහත් බිම් | | උස් බිම් | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|
| | අක්කර | % | අක්කර | % | අක්කර | % | අක්කර | % |
| තනි අයිතිය | 37.11 | 96.11 | 338.00 | 92.22 | 0.25 | 11.11 | 375.36 | 92.14 |
| අඳයට ගත් | 0.00 | 0.00 | 2.50 | 0.68 | 0.00 | 0.00 | 2.50 | 0.61 |
| බද්දට ගත් | 0.00 | 0.00 | 1.25 | 0.34 | 0.00 | 0.00 | 1.25 | 0.31 |
| උගසට ගත් | 0.00 | 0.00 | 0.00 | 0.00 | 2.00 | 88.89 | 2.00 | 0.49 |
| අනුන්ට අයත් | 0.75 | 1.94 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.75 | 0.18 |
| බෙත්ම | 0.00 | 0.00 | 16.25 | 4.43 | 0.00 | 0,00 | 16.25 | 3.99 |
| දෙමාපියන්ට අයත් | 0.75 | 1.94 | 8.50 | 2.32 | 0.00 | 0.00 | 9.25 | 2.27 |
| **එකතුව** | **38.61** | **100.00** | **366.50** | **100.00** | **2.25** | **100.00** | **407.36** | **100.00** |

දෙවන පරම්පරාව සඳහා පදිංචියට මෙන්ම වගා කිරීමට ඉඩම් ප්‍රමාණවත් නොවීම නිසා ඔවුන්ට ප්‍රධාන වශයෙන් විදේශ රැකියා සඳහා යොමුවීමට සිදුව ඇත. ඉඩම් ආරාවුල් කිසිවක් නොමැති වීමට හේතුව ජනපද ඉඩම් වීමයි.

### 2.4.4 කෘෂිකර්මය

අධ්‍යන ප්‍රදේශයේ-ජනගහණය මුළුමනින්ම වාගේ කෘෂිකර්මය ප්‍රධාන ජීවනෝපාය කරගෙන ඇති අතර කුටුම්භ ආදායමෙන් 85%-90% පමණ කෘෂිකර්මික අංශයේ දායකත්වය ලබයි.

**වාරිමාර්ග ක්‍රම**

මහවැලි ව්‍යාපාරයට පෙර මෙම ප්‍රදේශයේ පැවැති සම්ප්‍රදායික ගොවි ගම්මාන, වාරිමාර්ග සහිත වී වගාව සහ හේන් වගාව ප්‍රධාන ජීවනෝපාය කරගෙන සිටියහ. කුඹුරු ඉඩම්වලට ජලය සැපයුනේ සුළු වාරිමාර්ග වැව් මගිනි. මාස් කන්නයේ කුඹුරු ප්‍රමාණයෙන් 90% ක් පමණ (සාමාන්‍යය වශයෙන්) වගා වූ අතර යල් කන්නයේදී වගාවූයේ 40%-60% අතර ප්‍රමාණයකි. මේ තත්වය මහවැලි සංවර්ධන ව්‍යාපාරයක් සමගම වෙනස් වේ.

වගු අංක 2.7

| ක්‍රමය | මහ 2001/02 | | යල 2002 | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | අක්කර | % | අක්කර | % | අක්කර | % |
| මහා වාරිමාර්ග | 209.77 | 88.09 | 97.35 | 73.21 | 307.12 | 82.76 |
| කෘෂි ළිං | 0 | 0 | 1.25 | 0.94 | 1.25 | 0.34 |
| ඇල/ඔය | 12.50 | 5.25 | 12.25 | 9.21 | 24.75 | 6.67 |
| වර්ෂාපෝෂිත | 1.00 | 0.42 | 0 | 0 | 1.00 | 0.27 |
| සුළු වාරිමාර්ග | 1.00 | 0.42 | 0 | 0 | 1.00 | 0.27 |
| වාරිතාකර නොමැති | 13.87 | 5.82 | 22.12 | 16.64 | 35.99 | 9.70 |
| **එකතුව** | **238.14** | **100.00** | **132.97** | **100.00** | **371.11** | **100.00** |

වර්තමානයේ වී වගා බිම්වලින් 83% ක් මහා වාරිමාර්ග යටතේ වන අතර7% ක් ඇල මාර්ග යටතේ වගා කරයි. තැන තැන විසිර උස් බිම් (ගොඩ ඉඩම්) වගාව ද, වර්ෂා ජලය මත රඳා පවතින අතර සුළු ප්‍රමාණයක් කෘෂි ළිං ආශ්‍රිතව වගා කෙරේ.

## I. කුඹුරු ඉඩම් භාවිතය

මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සෑද පවුලටම කුඹුරු ඉඩම් අක්කර 2 1/2 ක් ලබාදී ඇති අතර, ඉඩම් භාවිතයේදී මහා වාරි මාර්ග යටතේ වී වගාව ප්‍රධානවේ.

වගු අංක 2.8

| අස්වැන්න | මහ 2001/02 | | යල 2002 | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | අක්කර | % | අක්කර | % | අක්කර | % |
| මිරිස් | 1.77 | 0.79 | 15.74 | 12.11 | 17.51 | 4.93 |
| පෝල් | 0.00 | 0.00 | 0.75 | 0.58 | 0.75 | 0.21 |
| වට්ටක්කා | 0.00 | 0.00 | 8.75 | 6.73 | 8.75 | 2.46 |
| වී | 222.75 | 98.88 | 61.25 | 47.13 | 284.00 | 79.95 |
| උඳු | 0.00 | 0.00 | 25.25 | 19.43 | 25.25 | 7.11 |
| මුං ඇට | 0.00 | 0.00 | 2.12 | 1.63 | 2.12 | 0.60 |
| වැටකොලු | 0.00 | 0.00 | 1.86 | 1.43 | 1.86 | 0.52 |
| තක්කාලි | 0.00 | 0.00 | 1.00 | 0.77 | 1.00 | 0.28 |
| කැකිරි | 0.00 | 0.00 | 1.00 | 0.77 | 1.00 | 0.28 |
| ලොකු ළූණු | 0.00 | 0.00 | 3.50 | 2.69 | 3.50 | 0.99 |
| සෝයා බෝංචි | 0.00 | 0.00 | 3.00 | 2.31 | 3.00 | 0.84 |
| දුම්කොළ | 0.00 | 0.00 | 1.75 | 1.35 | 1.75 | 0.49 |
| රට කජු | 0.00 | 0.00 | 0.25 | 0.19 | 0.25 | 0.07 |
| එළවළු | 0.00 | 0.00 | 1.00 | 0.77 | 1.00 | 0.28 |
| ගැට කැකිරි | 0.00 | 0.00 | 0.50 | 0.38 | 0.50 | 0.14 |
| බඩ ඉරිඟු | 0.00 | 0.00 | 1.00 | 0.77 | 1.00 | 0.28 |
| පිපිඤ්ඤා | 0.00 | 0.00 | 0.25 | 0.19 | 0.25 | 0.07 |
| බතල | 0.50 | 0.22 | 0.00 | 0.00 | 0.50 | 0.14 |
| ගෝවා | 0.25 | 0.11 | 0.00 | 0.00 | 0.25 | 0.07 |
| කුරක්කන් | 0.00 | 0.00 | 1.00 | 0.77 | 1.00 | 0.28 |
| **එකතුව** | **225.27** | **100.00** | **129.97** | **100.00** | **355.24** | **100.00** |

2001/2002 මහ කන්නයේ 99% ක් ම කුඹුරු බිම් භාවිතා කර ඇත්තේ වී වගාව සඳහායි. 2002 යල කන්නයේ වී වගාව සඳහා යොදාගෙන ඇති කුඹුරු බිම් ප්‍රමාණය 47% කි. ඉතිරි 53% බිම් ප්‍රමාණය අතිරේක බෝග හා එළවළු වගා කිරීමට භාවිතා කර ඇත.

2002 යල කන්නයේ අතිරේක බෝග වගාව සලකන විට මුළු කුඹුරු බිම් ප්‍රමාණයෙන් 19% ක බිම් ප්‍රමාණයක උඳු වගාවද 12% ක මිරිස් ද, වගා කර තිබිණි. අතීතයේදී මෙම ප්‍රදේශයේ යල කන්නයේ වී වගාවට අමතරව ප්‍රධාන වගාව බවට පත්ව තිබුණේ මිරිස් වගා කිරීම වුවද මේ වන විට එම තත්ත්වය වෙනස් වී ඇත. රෝග හා පලිබෝධ උවදුරු නිසා ද අලෙවි ගැටළු පැවතීම නිසාද මෙලෙස මිරිස් වගාවෙන් ගොවීන් ඉවත් වී ඇත. යල කන්නයේ එළවළු වගාවසලකා බලන විට වඩාත් වැදගත් වන්නේ වට්ටක්කා වගාවයි. එය බිම් ප්‍රමාණයෙන් 7%ක් පමණ වේ.

## II. වී වගාවේ ඵලදායීතාවය

2001/2002 මහ කන්නයේ වගාව ඵලදායීතාවය සලකන විට හෙක්ටයාර් 1ට මෙට්‍රික් ටොන් 4.86 ක් (අක්කර 1 බුසල් 88.36) විය. නමුත් මහා වාරිමාර්ග ක්‍රමයක් යටතේ වියලි කලාපයේ මෙම අස්වැන්න

පිලිබඳව සෑහීමකට පත්විය නොහැක. ඵලදායීතාවය අඩුවීමට ඉදිරියේදී සාකච්ඡා කරනු ලබන හේතු බලපා ඇති අතර මෙයින් ප්‍රධාන වනුයේ නිසි ජල කළමණාකරණයක් නැතිකම සහ ප්‍රමාණවත් පරිදි පොහොර භාවිතා නොකිරීම හා වර්ධනය වන අවධියේ වගාවට නිසි ලෙස සාත්තු නොකිරීමත්, හොඳ දියුණු කල බීජ වර්ග පාවිච්චි නොකිරීමත් යන කරුණු ය.

**<u>වැඩි දියුණු කරන ලද නව බීජ වර්ග සපයා ගැනීමේ අපහසුව, සහනදායී ණය, පොහොර තාක්ෂණික දැනුම හා අලෙවිය සම්බන්ධ ගැටළු</u>**

ගල්කිරියාගම කොට්ඨාශ කලමණාකරණ කාර්යාලය මෑත කාලීනව කෘෂි කාර්මික කටයුතු සඳහා දන්වන ලද අනුග්‍රහය හා ක්‍රියාකාරීත්වය පහල මට්ටමක පවතින බව පෙනීයයි. එයට ප්‍රධානතම හේතුව වන්නේ නිලධාරීන්ගේ හිඟයයි. මුළු කොට්ඨාශය සඳහා සිටිනුයේ එක් කෘෂිකර්ම නිලධාරිවරයෙකු පමණි. එමෙන්ම ඒකක කළමණාකරුවෙකු ඒකක කීපයක වැඩ බැලීමද කරනු ලබයි. මහවැලි ප්‍රදේශයන් සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හෝ ගොවිජන සේවා දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ සම්බන්ධතාවයක් නොමැත. මේ නිසාම ගොවිජන බැංකු ක්‍රමයද මහවැලි කලාපය තුල ක්‍රියාත්මක නොවේ. බීජ ලබාගැනීම්, පොහොර ලබාගැනීම්, තාක්ෂණික දැනුම ලබාගැනීම මෙන්ව කෘෂිකාර්මික ණය ලබාගැනීවේ ගැටළු ගොවීන් වෙත පවතී.

## III. අලෙවි මාර්ග හා අලෙවිය සම්බන්ධ ගැටළු

2001 / 2002 මහ කන්නයේ වී අලෙවිය පිළිබඳව සලකන විට 94% ක්ම වී අලෙවි කර ඇත්තේ පුද්ගලික අංශයේ වෙළදුන්ටය. 2002 යල කන්නයේ වී අලෙවි කටයුතු සලකා බලන විට 83% ක් වී අලෙවි කර ඇත්තේ ද පුද්ගලික අංශයේ වෙළදුන්ටය. සාමාන්‍යයෙන් මහ කන්නයේ වී අස්වැන්නෙන් 78% ක් වී අලෙවි කිරීම ගොවීන් කරනු ලබයි. මහ කන්නයේ ගොවීන්ගෙන් 34% ක් යෙදවුම් ණයට ගැනීමේ හේතුව නිසා පුද්ගලික අංශය වෙත වී අලෙවි කිරීමට සිදුවන බව දන්වා ඇත.

ගොවීන්ගෙන් 43% ක් පුද්ගලික අංශයේ වෙළදුන් වෙත වී අලෙවි කිරීමට හේතුව වශයෙන් දක්වා ඇත්තේ වී අලෙවි කිරීමට ඇති එකම මාර්ගය එය නිසා බවයි. ගොවීන්ගෙන් 16% ක් වැඩි මිලක් ලබා ගැනීමට පුද්ගලික අංශයේ වෙළදුන් වෙත වී අලෙවි කරන බව දක්වා ඇත.

## 2002-2003 මහ කන්නයේ සහ 2003 යල කන්නයේ ප්‍රදේශයේ පැවති අලෙවි මිළ ගණන්

වගු අංක 2.9

| අස්වැන්න | අලෙවි මාර්ග | මහ 2001/02 | | යල 2002 | | එකතුව | | අන්තර | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු/කි | % | රු/කි | % | රු/කි | % | රු/කි | % |
| මිරිස් | පෞද්ගලික වෙළෙන්දාට | 52.14 | 64.26 | 85.50 | 100.00 | 137.64 | 82.60 | 37.88 | 62.12 |
| | දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය | 29.00 | 35.74 | 0.00 | 0.00 | 29.00 | 17.40 | 100.00 | 0.00 |
| **එකතුව** | | **81.14** | **100.00** | **85.50** | **100.00** | **166.64** | **100.00** | | |
| වට්ටක්කා | පෞද්ගලික වෙළෙන්දාට | 0.00 | 0.00 | 12.11 | 45.51 | 12.11 | 34.99 | 0.00 | 100.00 |
| | දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය | 8.00 | 100.00 | 14.50 | 54.49 | 22.50 | 65.01 | 35.56 | 64.44 |
| **එකතුව** | | **8.00** | **100.00** | **26.61** | **100.00** | **34.61** | **100.00** | | |
| වී | පෞද්ගලික වෙළෙන්දාට | 12.66 | 51.34 | 12.30 | 100.00 | 24.96 | 67.53 | 50.72 | 49.28 |
| | රජයේ ආයතනයට | 12.00 | 48.66 | 0.00 | 0.00 | 12.00 | 32.47 | 100.00 | 0.00 |
| **එකතුව** | | **24.66** | **100.00** | **12.30** | **100.00** | **36.96** | **100.00** | | |
| උඳු | පෞද්ගලික වෙළෙන්දාට | 0.00 | 0.00 | 29.65 | 49.71 | 29.65 | 49.71 | 0.00 | 100.00 |
| | දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය | 0.00 | 0.00 | 30.00 | 50.29 | 30.00 | 50.29 | 0.00 | 100.00 |
| **එකතුව** | | **0.00** | **0.00** | **59.65** | **100.00** | **59.65** | **100.00** | | |
| මුං ඇට | පෞද්ගලික වෙළෙන්දාට | 0.00 | | 49.33 | | 49.33 | | 0.00 | 100.00 |
| වැටකොළු | පෞද්ගලික වෙළෙන්දාට | 0.00 | 0.00 | 18.00 | 52.33 | 18.00 | 29.80 | 0.00 | 100.00 |
| | දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය | 26.00 | 100.00 | 16.40 | 47.67 | 42.40 | 70.20 | 61.32 | 38.68 |
| **එකතුව** | | **26.00** | **100.00** | **34.40** | **100.00** | **60.40** | **100.00** | | |
| ලොකු ළූණු | පෞද්ගලික වෙළෙන්දාට | 0.00 | | 16.33 | | 16.33 | | 0.00 | 100.00 |
| සෝයා බෝංචි | පෞද්ගලික වෙළෙන්දාට | 0.00 | | 18.00 | | 18.00 | | 0.00 | 100.00 |
| තක්කාලි | පෞද්ගලික වෙළෙන්දාට | 0.00 | | 8.00 | | 8.00 | | 0.00 | 100.00 |
| එළවළු | පෞද්ගලික වෙළෙන්දාට | 0.00 | | 12.00 | | 12.00 | | 0.00 | 100.00 |
| බඩ ඉරිඟු | පෞද්ගලික වෙළෙන්දාට | -0.00 | | 13.33 | | 13.33 | | 0.00 | 100.00 |
| පිපිඤ්ඤා | පෞද්ගලික වෙළෙන්දාට | 0.00 | | 10.00 | | 10.00 | | 0.00 | 100.00 |
| බතල | පෞද්ගලික වෙළෙන්දාට | 3.00 | | 0.00 | | 3.00 | | 100.00 | 0.00 |
| ගෝවා | පෞද්ගලික වෙළෙන්දාට | 9.00 | | 0.00 | | 9.00 | | 100.00 | 0.00 |

වගු අංක 2.9 පෙන්වා දී ඇති පරිදි 2001/2002 මහ කන්නයේ පුද්ගලික අංශයේ වෙළඳුන් විසින් වී මිලදී ගන්නා ලද සාමාන්‍ය මිල කි.ග්‍රෑම්. එකක් රු 12.66 ක් වූ අතර 2002 යල කන්නයේදී එය රු 12.30 ක් විය. අතිරේක බෝග සම්බන්ධයෙන්ද පැවති මිල ගොවියන් විසින් අඩු මිලක් වශයෙන් සලකනු ලදි. වී මිල සම්බන්ධයෙන්ද ගොවියන් එවැනිම ආකල්පයක් දරන ලදි. ක්ෂේත්‍ර සමීක්ෂණයේදී පැහැදිලිවම අනාවරණය වූ පරිදි 2002 යල කන්නයේදී පෞද්ගලික අංශයේ වෙළඳුන් විසින් වියළි මිරිස් කි.ග්‍රෑම්. එකක්

සඳහා ගෙවන ලද සාමාන්‍ය මිල රු 85 ක් වූ අතර උඳු සඳහා රු 29.65 ක්ද මුං ඇට සඳහා රු 49.33 ක් ද ලොකු ළූණු සඳහා රු 16.33 ක් සහ සෝයා බෝංචි සඳහා රු 18 ක්ද ගෙවා තිබිණි. කෘෂිකාර්මික අලෙවි අංශයේ පවත්නා මිල පිළිබඳ ගැටළු විසඳීම සඳහා මහවැලි සංවර්ධන අධිකාරියේ සහයෝගය ලබාදීම සඳහා ගල්කිරියාගම ගොවි සංවිධාන බල මණ්ඩලය සැලැස්මක් ඉදිරිපත් කර ඇත.

## 2.4.5. සත්ව පාලනය

සත්ව පාලන කටයුතු සඳහා මෙම ගම්මානයේ ගොවීන් යොමුවීමක් දක්නට නොමැත. ගවයන් ඇති කරන ලබන ගොවීන් වුවද ඔවුන්ගේ කිරි ලබා ගැනීමක් බොහෝ විට නොකරයි. එමෙන්ම ගවයන් කෘෂි කාර්මික කටයුතු සඳහා යොදා ගැනීමද සිදු නොවේ. ගවයන් ඇති කිරීම සඳහා තණ භූමි නොමැතිකම ගව පාලනයට මෙන්ම එලු පාලනයටද ගොවීන් යොමුනොවීමට හේතුවයි. මෙම ප්‍රදේශයේ තරමක් හෝ දුරට පවතින්නේ කුකුල් පාලනය පමණි. දැඩි වියළි කාලගුණ තත්වයක් පැවතීම නිසා කුකුල් පාලනයේ ද ඵලදායීතාවය පිලිබඳ සැක සහිතය. මෙම නිසා මෙම ගම්මානයේ සත්ත්ව පාලන කටයුතු දියුණු කිරීමට ඇති ශක්‍යතාවය බෙහෙවින් අල්පය.

## 2.4.6 ස්වයං රැකියා

ස්වයං රැකියා සඳහා මෙම ගම්මානයේ ගොවි ජනතාව වැඩි නැඹුරුවක් දක්වා නොමැත. ස්වයං රැකියා සඳහා ප්‍රදේශයේ ස්වභාවික සම්පත්වල හිඟයක් පවතින නමුදු කෘෂිකාර්මික නිෂ්පාදන හා සම්බන්ධ ස්වයං රැකියා ආරම්භ කිරීමේ විභවතාවක් මෙම ප්‍රදේශයේ පවතී. බහුල වශයෙන් නොවුනද ප්‍රදේශයේ ඇතිකරනු ලබන ගවයන්ගෙන් ලබා ගන්නා කිරි අමුද්‍රව්‍ය වශයෙන් යොදා යෝගට් නිෂ්පාදනය කල හැකිවේ. එමෙන්ම යල කන්නයේ බහුල වශයෙන් වගා කරනු ලබන බෝගයක් වූ උඳු භාවිතා කර පපඩම් නිෂ්පාදනයද කල හැකි වේ. මෙම ගම්මානයේ වගා කරනු ලබන තවත් ප්‍රධාන වගාවක් වන මිරිස්වලින් මිරිස් කුඩු නිෂ්පාදනය කිරීමට නොහැකිවන්නේ දේශීය වියලි මිරිස් වලින් නිෂ්පාදනය කරනු ලබන මිරිස්කුඩු කල් තබාගැනීමට නොහැකි වීමයි. සහල් ආශ්‍රිත නිෂ්පාදනයන් කිරීමේ වැඩි ශක්‍යතාවක් මෙම ප්‍රදේශයේ පවතී. ක්ෂණික ඉඳිආප්ප පිටි, ආප්ප පිටි, උසස් තත්ත්වයේ සහල් සැකසීම, සහල් නුඩ්ල්ස් නිෂ්පාදනය එලෙස කල හැකි වන සහල් ආශ්‍රිත නිෂ්පාදනයන් වේ. ගඩොල් නිෂ්පාදනයට අවශ්‍ය වන අමුද්‍රව්‍ය මෙම ගම්මානයේ පැවතුනද එමගින් සිදුවන පාරිසරික හානිය නිසා එය දියුණු කිරීම ගැටළු සහගත වේ.

යෝගට් නිෂ්පාදනය සඳහා මේ වන විට බාධක හා ගැටළු නොමැති අතර පපඩම් නිෂ්පාදනයේදී උඳු වලින් උඳු පිටි සකස් කර ගැනීමේ ගැටළුවක් පවතී. උඳු වල පොත්ත ඉවත් කිරීමේ සරල යන්ත්‍රයක් මේ වන තුරු නොමැති වීම එම ගැටළුවයි. සහල් ආශ්‍රිත නිෂ්පාදන ඇති කිරීම් ප්‍රධානතම ගැටළුව හා බාධක වශයෙන් දක්නට ඇත්තේ එම නිෂ්පාදන ආරම්භ කිරීම් ඉහල ප්‍රාග්ධනයක් ආයෝජනය කිරීමට සිදුවීමයි. මෙම ගැටළු මග හරවා ගැනීම කලහොත් සාර්ථකව ස්වයං රැකියා ලෙස මෙම කර්මාන්ත කල හැකි වේ.

## 2.5 ආදායම් මට්ටම්

වී වගා කරනු ලබන ගොවීන්ගේ සාමාන්‍ය වාර්ෂික ආදායම කන්න දෙකම සඳහා වනුයේ රු: 120000.00 කි. නමුත් කුඹුරු අක්කර 2.5 ක් කන්න 2 ක් වගා කිරීම සඳහා වැයවන මුදල අධික වීම නිසා ඔවුන් ලබන ලාභය සැලකිය යුතු මට්ටමක නොමැත. මේ අනුව ගොවි පවුලෙන් ලබන ශුද්ධ ආදායම රු:60,000.00- රු:75,000.00 අතර ප්‍රමාණයකි. ඒ අනුව ගොවි පවුලක් ලබන මාසික ආදායම රු:5000.00 පමණය.

යල කන්නයේදී එළවළු හා අතිරේක බෝග වගා කිරීම තුලින් ඔවුන් වී වගා කිරීමෙන් ලබන ආදායමට වඩා වැඩි ආදායමක් උපයා ගනී. යල කන්නයේ එළවළු හා අතිරේක බෝග වගා කරනු ලබන බිම් ප්‍රමාණය සාමාන්‍යයෙන් 50%කට ආසන්න වේ. ගොවි කුටුම්භ ආදායම උපරිම කිරීම සඳහා කුඹුරු වල වාණිජ බෝග වගා කිරීමටත්, වැඩිපුර පවුලේ ශ්‍රමය භාවිතා කිරීමටත් ගොවීන් පෙලඹී ඇත. එහෙත් දිනෙන් දින ඉහල යන යාන්ත්‍රික උපකරණ භාවිත සඳහා මිලත්, කෘෂි යෙදවුම් සඳහා වන මිලත් නිසා ගොවීන්ගේ නිෂ්පාදන වියදම අවම කිරීමේ උපාය මාර්ග නිසා ප්‍රතිඵල ලබාදීමට අසමත්ව ඇත.

## 2.6 අධ්‍යයන ප්‍රදේශයේ ජීවන හා සමාජ තත්ත්වය හා සම්බන්ධ පරාමිතිකයන්

### 2.6.1 අධ්‍යාපන තත්ත්වය

අධ්‍යයන ප්‍රදේශයේ ජනගහණයේ අධ්‍යාපන තත්ත්වය අනුව ව්‍යාප්තිය වගු අංක 2.10 න් පැහැදිලිව දක්වා ඇත.

වගු අංක 2.10

| ස්වභාවය | පිරිමි | % | ගැහැණු | % | එකතුව | % |
|---|---|---|---|---|---|---|
| පාසල් නොගිය ලිවීමට කියවීමට නොහැකි | 6 | 3.08 | 12 | 6.52 | 18 | 4.75 |
| පාසල් නොගිය ලිවීමට කියවීමට හැකි | 4 | 2.05 | 0 | 0.00 | 4 | 1.06 |
| ප්‍රාථමික ශ්‍රේණි | 35 | 17.95 | 43 | 23.37 | 78 | 20.58 |
| කණිෂ්ඨ ශ්‍රේණි | 66 | 33.85 | 48 | 26.09 | 114 | 30.08 |
| අ.පො.ස (සා.පෙළ) සමත් | 50 | 25.64 | 52 | 28.26 | 102 | 26.91 |
| අ.පො.ස (උ.පෙළ) සමත් | 24 | 12.31 | 17 | 9.24 | 41 | 10.82 |
| උපාධිධාරී | 2 | 1.03 | 4 | 2.17 | 6 | 1.58 |
| වෙනත් | 7 | 3.59 | 8 | 4.35 | 15 | 3.96 |
| වාර්තා කර නැති | 1 | 0.51 | 0 | 0.00 | 1 | 0.26 |
| **එකතුව** | **195** | **100.00** | **184** | **100.00** | **379** | **100.00** |

ජනගහණයෙන් 16% පමණ අ.පො.ස. උසස් පෙළ හා ඉහල අධ්‍යාපන හා තාක්ෂණික අධ්‍යාපනයක් ලබා තිබීම විශේෂ ලක්ෂණයකි.

**<u>සාක්ෂරතාවය හා අධ්‍යාපනය සම්බන්ධ වෙනත් නිරීක්ෂණ</u>**

මුළු ජන සංඛ්‍යාවෙන් 95%කටම කියවීමට හා ලිවීමට හැකියාව පවතී. ස්ත්‍රීන්ගෙන් 93.5%ක් සහ පුරුෂයින්ගෙන් 97%කටම ලිවීමේ හා කියවීමේ හැකියාව පවතී. ජන සංඛ්‍යාවෙන් වැඩිම ප්‍රතිශතය එනම් 30%ක් ද්විතියික අධ්‍යාපනය ලැබූවන් වන අතර 27% කි. අ.පො.ස. (උසස් පෙළ) සමත්වූවන්ගේ සංඛ්‍යාව 11%ක් පමණ වේ. උසස් අධ්‍යාපනය ලැබූ සංඛ්‍යාව 2% ට අඩු මට්ටමක පවතී. පාසල් අධ්‍යාපනයක් නොලැබූ සංඛ්‍යාව 6%ක් වුවත් එයින් 1%කට ලිවීමට හා කියවීමට හැකියාව පැවතිනි.

අළුත් ගල්කිරියාගම ගම්මානය කෙලවර උසස් අධ්‍යාපන පහසුකම් සහිත මධ්‍ය මහා විද්‍යාලයක් පිහිටා ඇත. මෙම නිසා මෙම ගම්මානයේ සිසුනට අධ්‍යාපනය ලබා ගැනීමේ කිසිඳු ගැටළුවක් නොමැත.

## 2.6.2 නිවාස තත්ත්වය හා අයිතිය

ජනපදිකයින්ගේ ජීවන තත්වය පෙන්වන තවත් ප්‍රබල නිර්ණයකයක් (දර්ශකයක්) නම් ඔවුන්ගේ නිවාස තත්වය හා ඒ ආශ්‍රිත සනීපාරක්ෂක පහසුකම් හා ක්‍රම භාවිතය පිළිබඳ දර්ශකයයි. අධ්‍යයන ප්‍රදේශයේ නිවාස බුක්තිය පිළිබඳ තොරතුරු වගු අංක 2.11 මගින් පැහැදිලිව දක්වා ඇත.

වගු අංක 2.11

| **නිවාස තත්ත්වය** | **නො:** | **%** |
|---|---|---|
| ජනපද නිවාස | 38 | 45.24 |
| ජනපද නිවාස නොවන | 43 | 51.19 |
| අයිති නොවන හා කුලී නිවැසියෙකුද නොවන | 2 | 2.38 |
| වෙනත් | 1 | 1.19 |
| **එකතුව** | **84** | **100.00** |

මුළු නිවාස සංඛ්‍යාවෙන් 96% කටම නිවාසයේ අයිතිය හිමිව පවතී. එයින් 45% ක් පදිංචිව සිටිනුයේ ජනපද නිවාස වල වන අතර 51%ක් පදිංචිව සිටිනුයේ තම කුඹුරු බිම්වල වේ. නිවාස සඳහා වෙන් කරනු ලැබූ උස් බිම් වල ජල හිඟයක් පැවතීමත් කුඹුරු බිම් වල පදිංචිවීමෙන් කෘෂි කාර්මික කටයුතු කිරීම හා රැක බලා ගැනීම වඩාත් පහසු වීමත් නිසා ගොවීන් තම කුඹුරුබිම් වලට පදිංචියට ගොස් ඇත.

### 1. නිවාසවල ගෙබිම

මෙම ප්‍රදේශයේ පසුගිය වසර 25 තුල නිවාස තත්ත්වය සීඝ්‍රයෙන් වැඩි දියුණු වී තිබේ.

වගු අංක 2.12

| වර්ගය | සො: | % |
|---|---|---|
| මැටි | 23 | 25.27 |
| සිමෙන්ති | 67 | 73.63 |
| ගඩොල් අතුරන ලද | 1 | 1.10 |
| **එකතුව** | **91** | **100.00** |

නිවාස සංඛ්‍යාවෙන් 74% කම ගෙබිම සිමෙන්ති දමා සකස්කර ඇති අතර මැටි වලින් ගෙබිම සකස්කර ඇත්තේ 25% ක පමණි.

## 11. නිවාස වල බිත්ති

වගු අංක 2.13

| වර්ගය | සො: | % |
|---|---|---|
| මැටි | 9 | 10.71 |
| ගඩොල් | 74 | 88.10 |
| සිමෙන්ති ගල් | 1 | 1.19 |
| **එකතුව** | **84** | **100.00** |

මුළු නිවාස සංඛ්‍යාවෙන් 89% කම බිත්ති බැඳ ඇත්තේ ගඩොල් වලිනි. මැටිවලින් බිත්ති සකස් කර ඇත්තේ 11%ක පමණි. මෙම ප්‍රදේශයේ ගඩොල් නිෂ්පාදනය කර ගැනීම සඳහා අමුද්‍රව්‍ය බහුලව පැවතීම නිසා නිවාස සැදීමට ගඩොල් භාවිතය ඉහල යැම සිදුවී ඇත.

## 111 නිවාස වල වහල

වගු අංක 2.14

| වර්ගය | සො: | % |
|---|---|---|
| උළු | 70 | 83.33 |
| ලෝහ තහඩු | 9 | 10.71 |
| පොල්අතු/ඇස්බැස්ටෝස් | 5 | 5.95 |
| **එකතුව** | - **84** | **100.00** |

නිවාස වලින් 83%කට වහල සෙවිලි කිරීමට උළු භාවිතා කර ඇත. සෙවිලි තහඩු භාවිතය 10%ක් වේ.

## IV නිවාස වල වර්ග ප්‍රමාණය

සම්ප්‍රදායික නිවාසයක සාමාන්‍ය විශාලත්වය වර්ග අඩි 300 - 400 ක් අතර වූ අතර, මහවැලි ව්‍යාපාර සංවර්ධනයත් සමග මෙම ප්‍රදේශයේ නිවාසයක සාමාන්‍ය විශාලත්වය වැඩිවී ඇති අතර, දැනට ඇති නිවාස වලින් 44.2% වර්ග අඩි 1000ට වඩා විශාල නිවාස වේ.

වගු අංක 2.15

| වර්ග අඩි | නො: | % |
|---|---|---|
| 0-500 | 20 | 23.8 |
| 501-1000 | 27 | 32.1 |
| 1001-1500 | 28 | 33.3 |
| 1501-2000 | 7 | 8.3 |
| 2001-2500 | 2 | 2.4 |
| එකතුව | 84 | 100 |

සාමාන්‍යය වර්ගීකරණයලට අනුව බැලුවහොත් නිවාස වලින් 65%ක්ම වර්ග අඩි 500-1500 දක්වා වර්ග ප්‍රමාණයකින් යුක්තවේ. වර්ග අඩි 1500 ඉක්මවූ නිවාස සංඛ්‍යාව 10% කි. වර්ග අඩි 500 ට වඩා අඩු නිවාස සංඛ්‍යාව 25% කි. නිවාස වල වර්ග ප්‍රමාණයේ මධ්‍යනය අගය වන්නේ වර්ග අඩි 907 කි.

## V නිවාස වල කාමර ප්‍රමාණය

ප්‍රදේශයේ නිවාසවලින් 90% ක්ම කාමර 03කට වඩා ඇති නිවාස වේ. කාමර ප්‍රමාණය වැඩිවීමෙන් කාමරයක වසන ජනගයණ ඝනත්වයද සම්ප්‍රදායික තත්වයට වඩා අතිශයින් අඩු වී ඇත.

වගු අංක 2.16

| කාමර ගණන | නිවාස සංඛ්‍යාව | % |
|---|---|---|
| 1-2 | 7 | 8.6 |
| 3-4 | 26 | 32.1 |
| 5-6 | 30 | 37.0 |
| 7-8 | 18 | 22.2 |
| **එකතුව** | **81** | **100** |

නිවාස වලින් 69%කම කාමර ප්‍රමාණය 3 සිට 6 දක්වා වන අතර කාමර 6 ට වැඩි නිවාස වල ප්‍රතිශතය 22% ක්වේ. කාමර 1-2 අතර නිවාස සංඛ්‍යාව 9%කි. කාමර ප්‍රමාණයේ මධ්‍යනය අගය කාමර 5.25 කි. නිවාස පිළිබඳ තොරතුරු සලකා බැලීමේදී නිවාස වල අයිතිය මෙන්ම නිවාස වල තත්ත්වය සහ

පුස්තකාලය LIB... HARTI

ප්‍රමාණය යහපත් තත්ත්වයක පවතී. මෙම නිසා යහපත් ජීවන තත්ත්වයක් මෙම තොරතුරු වලින් පෙන්නුම් කරයි. ප්‍රධාන වශයෙන් කෘෂි කාර්මික කටයුතු වලින් පමණක් ආදායම් ලබන පුද්ගලයින් මෙවැනි උසස් ජීවන තත්ත්වයක් පෙන්නුම් කිරීම වැදගත් තොරතුරක් වේ.

### 2.6.3 ඉන්ධන භාවිතය

මෙම ප්‍රදේශය කෘෂිකාර්මික ප්‍රදේශයක් නිසා තම ගෙවත්තෙන් ප්‍රමාණවත් දර ප්‍රමාණයක් ලබා ගත හැකිය. එහෙත් වෙනත් ඉන්ධන භාවිතය සඳහා ගෘහණියන් යොමුවන බව වගු අංක 2.17 න් පැහැදිලිව පෙනේ.

වගු අංක 2.17

| ඉන්ධන | පවුල් සංඛ්‍යාව | % |
|---|---|---|
| දර | 84 | 47.19 |
| විදුලිය | 46 | 25.84 |
| භූමිතෙල් | 46 | 25.84 |
| ගෑස් | 18 | 22.2 |
| | 2 | 1.12 |
| **එකතුව** | **178** | **100.00** |

ආහාර පිසීම සඳහා 100% ක්ම දර භාවිතා කරන අතර 2% ක් ඒ සඳහා ගෑස්ද භාවිතා කරයි. ආලෝකය ලබා ගැනීම සඳහා 54% විදුලිය භාවිතා කරනු ලබන අතර 46% භාවිතා කරනුයේ භූමිතෙල්ය. පවුල් සංඛ්‍යාවෙන් 46% කට විදුලි බලය නොමැති වීමට ප්‍රධාන හේතුව වන්නේ ඔවුන් ප්‍රධාන මාර්ග අසල පිහිටි උස් බිම් වලින් ඉවත්ව තම කුඹුරු බිම් වල පදිංචියට යාමයි.

### 2.6.4 ගෘහ භාණ්ඩ අයිතිය

ගෘහ භාණ්ඩ අයිතිය පිළිබඳව වගු අංක 2.18 විශ්ලේෂණයට අනුව සම්ප්‍රදායික තත්වයේ සිට ක්‍රමික දියුණුවක් ලබා ඇති බව පෙනේ.

වගු අංක 2.18

| ගෘහ භාණ්ඩ | පවුල් සංඛ්‍යාව |
|---|---|
| ගුවන් විදුලිය | 77 |
| රූපවාහිනිය | 62 |
| ශීතකරණය | 13 |
| පුටු සෙටිය | 62 |
| කෑම මේසය | 59 |
| අල්මාරිය | 49 |
| බිත්ති ඔරලෝසුව | 81 |
| දුරකථනය | 1 |

ගෘහ භාණ්ඩ අයිතිය අතුරින් වැඩිම ප්‍රතිශතයක් හිමිව ඇත්තේ බිත්ති ඔරලෝසු වන අතර එය 96%කි. පදිංචිකරුවන්ගෙන් 73% කට රූපවාහිනී යන්ත්‍ර හිමිව පවතී. ශීතකරණ හිමි පවුල් සංඛ්‍යාව 15%කි. ගුවන් විදුලි යන්ත්‍ර හිමි පවුල් සංඛ්‍යාවද ඉහළ මට්ටමක පවතින අතර එය 91%කි. කෑම මේස 70% කටද අල්මාරි 58% කද හිමිව පැවතීම විශේෂ කරුනකි. දුරකථන හිමිව පැවතීම 1% කි.

### 2.6.5 වාහන අයිතිය

මෙම ප්‍රදේශයේ ප්‍රවාහණ යන්ත්‍ර හා උපකරණ අයිතිය අතින් මෝටර් සයිකල් හා පාපැදි ප්‍රධාන තැනක් ගනී. සම්ප්‍රදායික අවධියේ වැඩි වශයෙන් භාවිතා වූ බර කරත්ත සම්පූර්ණයෙන්ම අභාවයට ගොස් ඇති බව පෙනේ.

වගු අංක 2.19

| ඉන්ධන | පවුල් සංඛ්‍යාව | % |
|---|---|---|
| කාර් | 1 | 1.08 |
| පා පැදිය | 67 | 72.04 |
| යතුරු පැදිය | 24 | 25.81 |
| මෝටර් රථ | 1 | 1.08 |
| **එකතුව** | **93** | **100.00** |

පා පැදි හිමි පවුල් සංඛ්‍යාව 79% කි. 29% කට යතුරු පැදි හිමිව පවතින අතර මෝටර් රථ හිමි පවුල් සංඛ්‍යාව 1% කි.

### 2.6.6 කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ අයිතිය

ආදායම් තත්වය යහපත්වීමත් සමගම ගොවියන් කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ හිමිකරුවන් බවට පත්වීම ක්‍රමිකව සිදුවේ.

වගු අංක 2.20

| උපකරණ | පවුල් සංඛ්‍යාව | % |
|---|---|---|
| තෙල් ඉසින යන්ත්‍ර | 51 | 61.45 |
| වතුර පොම්ප | 6 | 7.23 |
| සුළං කිරීමේ යන්ත්‍ර | 4 | 4.82 |
| අත් ට්‍රැක්ටරය | 17 | 20.48 |
| රෝද හතරේ ට්‍රැක්ටරය | 3 | 3.61 |
| නඟුල් | 2 | 2.41 |
| **එකතුව** | **83** | **100.00** |

මෙහිදී වඩාත් වැදගත් වන්නේ 61% කට ස්ප්‍රේ යන්ත්‍ර හිමිවීමත් 20% කට අත් ට්‍රැක්ටර් හිමිවීමත්ය. වතුර පොම්ප 7% කටද රෝද හතරේ ට්‍රැක්ටර් 4% කට හිමිවීම කෘෂි කාර්මික ප්‍රදේශයක් වශයෙන් වැදගත්වේ.

### 2.6.7 සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම්

සෞඛ්‍යය හා සනීපාරක්ෂක පහසුකම් හා ක්‍රම භාවිතය අතින් ද මෙම ගම් සම්ප්‍රදායික තත්වයේ සිට ක්‍රමිකව යහපත් වර්ධනයක් පෙන්නුම් කරයි.

වගු අංක 2.21

| වර්ගය | පවුල් සංඛ්‍යාව | % |
|---|---|---|
| ජල මුද්‍රිත | 57 | 67.86 |
| වල සහිත | 26 | 30.95 |
| වැසිකිලි රහිත | 1 | 1.19 |
| **එකතුව** | **84** | **100.00** |

පවුල් සංඛ්‍යාවෙන් 99% කට වැසිකිලි පහසුකම් පැවතියද ජල මුද්‍රිත වැසිකිලි පැවතියේ 68% කට පමණි.

## 2.6.8. පානීය ජල පහසුකම්

සම්ප්‍රදායික ගම්මාන අවදියේදී මෙම වැසියන් පානීය ජලය ලබාගත්තේ වැවෙන් හෝ ලිඳෙනි. බොහෝ විට පොදු ළිඳකිනි.

වගු අංක 2.22

| ජල මූලාශ්‍රය | පවුල් සංඛ්‍යාව | % |
|---|---|---|
| තමාගේ ළිඳ | 44 | 52.38 |
| අසල්වැසියන්ගේ ළිඳ | 22 | 26.19 |
| පොදු ළිඳ | 18 | 21.43 |
| **එකතුව** | **84** | **100.00** |

පවුල් සංඛ්‍යාවෙන් 52% ක්ම පානීය ජලය ලබා ගනුයේ තමාගේ ළිඳෙනි. අසල්වැසියන්ගේ ළිඳෙන් පානීය ජලය ලබා ගන්නා පවුල් සංඛ්‍යාව 26% ක් වන අතර පොදු ළිං වලින් 22% ක් පානීය ජලය ලබා ගනී.

අස්වනු නෙලන සමය යන විට වාරි ජල සැපයුම අත් හිටුවන හෙයින් එම කාලය තුල ප්‍රදේශයේ ළිං වල ජලය සිඳී යාමක් සිදුවන හෙයින් ජල හිඟයක් ඇතිවේ.

## 2.6.9 ස්නානය හා අනෙකුත් කටයුතු සඳහා ජල පහසුකම්

සම්ප්‍රදායික ගම්මාන අවදියේදී මෙම ගම් වැසියන් සියල්ලෝම ස්නානය හා රෙදි සේදීම සඳහා වැව් ජලය භාවිතා කළෝය.

වගු අංක 2.23

| ජල මූලාශ්‍රය | පවුල් සංඛ්‍යාව | % |
|---|---|---|
| තමාගේ ළිඳ | 38 | 39.58 |
| අසල්වැසියන්ගේ ළිඳ | 5 | 5.21 |
| පොදු ළිඳ | 3 | 3.13 |
| ජල ටැංකිය/ඇළ මාර්ග | 46 | 47.92 |
| කරාම ජලය | 4 | 4.17 |
| **එකතුව** | **96** | **100.00** |

ස්නානය හා අනෙකුත් කටයුතු සඳහා 40% ක්ම ජලය ලබා ගනුයේ තමාගේ ළිඳෙනි. වැව සහ ඇළ මාර්ග 48% ක් ඒ සඳහා ජලය ලබා ගන්නා මූලාශ්‍ර වේ.

## 2.6.10 ග්‍රාමීය ප්‍රජා සංවිධාන හා ඒවායේ සහභාගීත්වය - ගොවි සංවිධානය0

පසුගිය වසර 25 තුල ග්‍රාමීය සංවිධාන හා ආයතන යහපත් ප්‍රගතියක් ලබා ඇති බව පැහැදිලිව පෙනේ.

වගු අංක 2.24

| සාමාජිකත්වය පිළිබඳ තොරතුරු | සංඛ්‍යාව | % |
|---|---|---|
| සාමාජික | 70 | 83.33 |
| නිලධාරි | 12 | 14.29 |
| සාමාජික නොවන | 2 | 2.38 |
| **එකතුව** | **84** | **100.00** |

ගොවි සංවිධානය, සමෘද්ධි කුඩා කණ්ඩායම්, මරණාධාර සමිතිය, බෞද්ධ සමිති ආදී සංවිධාන රාශියක් පැවතියද තිරසාර සංවර්ධන ගම්මාන වැඩ සටහන සඳහා සම්බන්ධව පවතින්නේ ගොවි සංවිධාන හා සමෘද්ධි කුඩා කණ්ඩායම් පමණි. ගොවි සංවිධානයේ සාමාජිකත්වය ලබා ගන්නා ලද ගොවි පවුල් ගනන 83% කි.

### 1. ගොවි සංවිධාන පිළිබඳ ගොවීන්ගේ අදහස්

ප්‍රදේශයේ ගොවි සංවිධාන ක්‍රියාකාරීත්වය පිළිබඳව කරුණු සෙවීමේදී ප්‍රශ්ණාවලියට අමතරව කෙටි සාකච්ජා මගින්ද කරුණු රැස්කර ගන්නා ලදී.

වගු අංක 2.25

| සතුටු දායක බව | සංඛ්‍යාව | % |
|---|---|---|
| ඔව් | 59 | 70.24 |
| නැත | 19 | 22.62 |
| වාර්තාගත නොවූ | 6 | 7.14 |
| **එකතුව** | **84** | **100.00** |

ගොවි සංවිධානයේ ක්‍රියාකාරීත්වය සතුටු දායක බව ගොවීන්ගෙන් 70% ප්‍රකාශ කර ඇති අතර 23% ක් සතුටු දායක නොමැති බවට අදහස් දක්වා ඇත.

### 11. ගොවි සංවිධානයේ දුර්වලතා

වගු අංක 2.26

| දුර්වලතා | සංඛ්‍යාව | % |
|---|---|---|
| සාමාජිකයින් ගොවි සංවිධානයේ කාර්යන් පිලිබඳ දැනුවත් නොකිරීම | 4 | 4.35 |
| ගොවි කටයුතු පිලිබඳව ගොවි සංවිධානයේ දායකත්වය සතුටු දායක නොවීම | 11 | 11.96 |
| ජල කලමනාකරණය නිසි අයුරින් සිදු නොකිරීම | 9 | 9.78 |
| සාමූහිකව ගත් තීරණ ක්‍රියාත්මක නොවීම | 3 | 3.26 |
| අලෙවි කටයුතු සංවිධානය නොකිරීම | 1 | 1.09 |
| ඇල වේලි පාරවල් සැලැස්මකට සිදු නොවීම | 1 | 1.09 |
| බෙත්ම බෙදීමේදී සිදුවන අසාධාරනකම් | 5 | 5.43 |
| වංචා සහගත ලෙස කටයුතු කිරීම | 3 | 3.26 |
| ගොවි සංවිධානය මුදල් ඉපයීමේ මාර්ගයක් ලෙස යොදා ගැනීම | 1 | 1.09 |
| සාමාජිකයින්ගේ සහභගීත්වයක් නොමැතිකම | 1 | 1.09 |
| වාර්තාගත නොවූ | 53 | 57.61 |
| **එකතුව** | **92** | **100.00** |

ගොවීන්ගෙන් 57% මේ පිලිබඳ අදහස් දක්වා නොමැති අතර 12% ක් පමණ පවසා ඇත්තේ ගොවි සංවිධානය කෘෂි කාර්මික කටයුතු වලට ලබාදෙන දායකත්වය  පිලිබදව සැහීමකට පත් විය නොහැකි බවයි. 10% ක් දක්වා ඇත්තේ ජල කලමනාකරණය නිසි අයුරින් සිදු නොවන බවයි. 5% ක් පවසා ඇත්තේ බෙත්ම බෙදීමේදී සිදුවන දුර්වලතායි.

## 2.6.11 කාන්තාවන් හා තරුණයින්ගේ තත්ත්වය

තරුණ වයසේ ජනගහණයේ අභිමතාර්ත හා ඒවා සපුරා ගැනීමේදී මුහුණපාන ගැටළු පිළිබඳ සංවෘත හා විවෘත සාකච්ඡා මාලාවක් සමීක්ෂණ අවදියේ පවත්වන ලදී.

වගු අංක 2.27

| පුහුණුවීම් | පිරිමි | % | ගැහැණු | % | එකතුව | % |
|---|---|---|---|---|---|---|
| කාර්මික පුහුණු | 3 | 1.53 | 1 | 0.54 | 4 | 1.05 |
| වාරි කලමනාකරණය | 2 | 1.02 | 0 | 0.00 | 2 | 0.53 |
| පාරම්පරික වෛද්‍ය වෘත්තිය | 1 | 0.51 | 0 | 0.00 | 1 | 0.26 |
| රෙදිපිලි | 0 | 0.00 | 1 | 0.54 | 1 | 0.26 |
| රියදුරු | 5 | 2.55 | 0 | 0.00 | 5 | 1.32 |
| කෘෂි කාර්මික හා සත්ත්ව පාලනය | 2 | 1.02 | 2 | 1.09 | 4 | 1.05 |
| රෝහල් සේවාව | 0 | 0.00 | 2 | 1.09 | 2 | 0.53 |
| නායකත්වය | 1 | 0.51 | 0 | 0.00 | 1 | 0.26 |
| වාර්තාගත නොවූ | 182 | 92.86 | 178 | | 360 | 94.74 |
| **එකතුව** | **196** | **100.00** | **184** | **100.00** | **380** | **100.00** |

වගු අංක 7 ට අනුව මුළු ජන සංඛ්‍යාවෙන් 95% කට කිසිදු හෝ වෘත්තිය පුහුණුවක් ලැබී නොමැත.

## 1. කාන්තා කුඩා කණ්ඩායම්

මෙම ගම්මානයේ කාන්තා කුඩා කණ්ඩායම් 4 ක් ඇති අතර එහි කාන්තාවන් 40ක් සාමාජිකත්වය ලබා ඇත. ඔවුන් කෘෂි කාර්මික කටයුතු වලට දායකත්වය ලබා දීම සහ ගෙදර දොර කටයුතු කිරීම හැරුණු විට වෙනත් කිසිදු ආර්ථික කටයුතු වල නියලී නොමැත. ඔවුන්ට රැකියා අවස්ථා නිර්මාණය කර දීම සඳහා අප ව්‍යාපෘතිය මගින් ස්වයං රැකියා පුහුණු පාඨමාලාවක් පවත්වන ලදී.

පුස්තකාලය
LIBRARY
PARTI

# තුන් වන පරිච්ඡේදය.

<u>සාධනය - තිරසාර සංවර්ධන ගම්මාන කාර්ය මූලික ව්‍යාපෘති කටයුතු</u>

## 3.1. ග්‍රාමීය ප්‍රවේශය

මෙම පරිච්ඡේදයේදී තිරසර සංවර්ධන ගම්මාන ව්‍යාපෘතිය යටතේ සංවර්ධන කාර්ය සංවිධානය හා ගැමි සහභාගීත්වය පදනම් කර ගත් වැඩ සටහන් සැලසුම් කිරීම හා එම සැලසුම් සඳහා පසුබිම්වූ කරුණු විශ්ලේෂණය කෙරේ. තිරසර සංවර්ධන ව්‍යාපෘති සඳහා මහවැලි H කලාපයේ ගම්මානයක් තෝරා ගැනීම සඳහා තඹුත්තේගම නේවාසික ව්‍යාපාර කලමණාකරණ කාර්යාලයෙන් මූලින්ම තොරතුරු ලබා ගන්නා ලදි. එහිදී ගල්කිරියාගම කොට්ඨාශ කලමණාකරණ බල ප්‍රදේශය ඒ සඳහා යෝග්‍ය බව හැගී ගිය අතර ගල්කිරියාගම කොට්ඨාශ කලමණාකරණ කාර්යාලයේ කොට්ඨාශ කලමණාකරු ඒකක කලමණාකරු හා කෘෂිකර්ම නිලධාරීවරයා විසින් අළුත් ගල්කිරියාගම ගම්මානය ඒ සඳහා යෝග්‍ය බවට නිර්දේශ කරන ලදී. මේ අනුව අළුත් ගල්කිරියාගම ගොවි සංවිධානයේ සභාපතිවරයාගේ මූලිකත්වය සහිතව අදාල රාජ්‍ය නිලධාරීන්ගේ සහායෙන් සමාරම්භක රැස්වීම 2002.10.07 දින ගල්කිරියාගම ප්‍රජාශාලාවේදී පවත්වන ලදී. ව්‍යාපෘති පිලිබඳව ගොවීන් දැනුවත් කිරීම ගොවි සංවිධාන සභාපතිවරයා සහ කෘ.ප.නි.ස. වරිය විසින් සිදු කරන ලදි.

## 3.1.2 සහභාගිත්ව ගැමි විමසුම

මේ සඳහා ගම්මානයේ ගොවීන් මෙන්ම ග්‍රාමීය, ප්‍රදේශීය හා දිස්ත්‍රික් මට්ටමේ රාජ්‍ය නිලධාරීන් සමඟ හෙ.කො.ගො.පු. ආයතනයේ නිලධාරීන් සහභාගී වන ලදි. මෙමගින් හඳුනා ගන්නා ලද ගැටළු සියල්ලම කෘෂි කාර්මික කටයුතු වලට සෘජුවම සම්බන්ධ වූ ඒවා වූ අතර විදුලි බලය මාර්ග වැනි යටිතල පහසුකම් පිලිබඳ ගැටළු කිසිවක් ගොවීන්ට වැදගත් ඒවා නොවිණි.

මෙහිදී හඳුනා ගන්නා ලද ගැටළු වූයේ

01. ගුණාත්මක තත්වයේ බීජ හිඟකම
02. කෘෂි කාර්මික ණය ලබා ගැනීමේ අපහසුතාව
03. ව්‍යාපෘති හා තාක්ෂණ සේවා නිසිලෙස නොලැබීම
04. වල් අලි උවදුර
05. කෘෂි නිෂ්පාදන අලෙවි කිරීමේ ගැටළු
06. ජල හිඟය (යල කන්නය සඳහා)
07. මහවැලි ප්‍රදේශයක් වෙනම කලාපයක් වශයෙන් පැවතීම නිසා වෙනත් රාජ්‍ය ආයතන සමඟ ගොවීන් සබඳතාවක් නොමැතිකම

මෙම ගැටළු සඳහා විසඳුම් සෙවීමේදී පලමුවෙන්ම කලයුතු කාර්යය වූයේ කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව ගොවි ජන සේවා දෙපාර්තුමේන්තුව වන ජීවී දෙපාර්තුමේන්තුව වැනි වෙනත් රාජ්‍ය ආයතන ගොවීන්ට සම්බන්ධ කරවීමය. හඳුනාගත් ගැටළු බොහොමයක් ඇතිවීමට හේතු වී තිබුනේද

වෙනත් රාජ්‍ය ආයතන ගොවීන්ට ලබා දෙන අනුග්‍රහයන් හා සේවාවන් මහවැලි ආයතනයට ලබාදීමට තිබූ නොහැකියාවයි.

### 3.1.3 සැලසුම් සැකසීම

මුලින්ම 2002/2003 මහ කන්නය පිලිබඳව වගා සැලැස්මක් සකස් කරන ලදි. හඳුනා ගත් ගැටළු වලට විසඳුම් එම සැලැස්මට අන්තර් ගත කල අතර මූලික වශයෙන් කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව හා ගොවි ජන සේවා දෙපාර්තුමේන්තුවේ අනුග්‍රහය මත ගොවීන් විසින් එම සැලැස්ම ක්‍රියාත්මක කිරීමට තීන්දු විය.

## 3. 2 සංවිධානාත්මක හා කළමණාකරණ ව්‍යුහය

සමාරම්භක රැස්වීමේදී තාක්ෂණික ක්‍රියාකාර කමිටුවක් පිහිටුවා ගන්නා ලදි. මහවැලි ආයතනය ඇතුළු සියළුම රාජ්‍ය ආයතන නියෝජනය වන පරිදි කමිටු සාමාජිකයින් පත් කර ගන්නා ලද අතර ගොවි සංවිධානයේ නිලධාරීන්ද එයට ඇතුලත් විය. එම කමිටුව මසකට වරක් රැස්විය යුතු අතර ඉදිරි සැලසුම් සකස් කිරීම කමිටුවේ කාර්ය භාරය විය. ඊට අමතරව උප කමිටු නිලධාරීන්ද පත් කරන ලදි. විශේෂයෙන්ම මිරිස් වගාව වන වගාව සඳහා උප කමිටු පත් කරන ලදි. එම උප කමිටුවල කාර්ය භාරය වූයේ එම වගාවන් පිලිබඳව තව දුරටත් ගැටළු හා වියදම් සොයා බලා සැලසුම් සකස් කිරීමයි.

ගොවි සංවිධානයක් හා කුඩා කණ්ඩායම් ගම්මානය තුල පිහිටි තිබූ හෙයින් ව්‍යාපෘති සැකසුම් කිරීමේදී අළුතින් සංවිධාන පිහිටුවීමට අවශ්‍යතාවයක් නොවිණි. තිබූ සංවිධාන නැවත ශක්තිමත් කිරීම පමණක් අපහට පැවර් තිබිණි. ගොවි සංවිධාන සඳහා මූලධනය ලබාගැනීමේ හා අරමුදල් උපයා ගැනීමේ ක්‍රම දියුණු කිරීමත්, අලෙවි ගැටළු සඳහා ගොවි සංවිධාන ප්‍රධානත්වයෙන් අලෙවි කමිටු පිහිටුවීමටත් සහභාගිත්ව පිරිසුම් අධ්‍යයනයේදී පියවර ගන්නා ලදී. අනාවරණය වූ ප්‍රධාන අලෙවි ගැටළු වගු අංක 3.1 හා 3.2 මගින් දක්වා තිබේ.

## 3. 3 ජනතා සහභාගීත්වය ලබා ගැනීම හා ඔවුන් ක්‍රියාකාරීන් බවට පත් කිරීම

මේ සඳහා ආරම්භක රැස්වීමේදී ක්ෂේත්‍ර බෝග සර්යේෂණ හා සංවර්ධන ආයතනයේ ශෂ්‍ය විද්‍යාඥයකු ලවා මිරිස් වගාව පිලිබඳව දේශනයක් ලබා දෙන ලදි. විශ්වාසය තහවුරු කිරීමේ උපක්‍රමයක් වශයෙන් ආයතනයේ මුදලින් MI2 මූලික මිරිස් බීජ කි.ග්‍රෑම්. 3 ක් ග්‍රෑම්.100 බැගින් ගොවීන් වෙත බෙදා දීම කරන ලදි. මෙතෙක් විවිධ රාජ්‍ය ආයතන විසින් කරන ලද රැස්වීම් හා පුහුණු සටහන් වලින් හෙම්බත්ව, රාජ්‍ය නිලධාරීන් කෙරේ අප්‍රසන්න හැගීමකින් සිටි ගොවීන් තුල ලොකු විශ්වාසයක් එමගින් ව්‍යාපෘතිය කෙරේ ගොඩ නැගිනි. මූලික මිරිස් බීජ කෙසේ වෙතත් සහතික මිරිස් බීජවත් ලබා ගැනීමට ගොවීන්ට මෙතෙක් අවකාශ නොපැවතිණි. දඹුල්ල වෙළඳ පොලේ පුද්ගලික බීජ වෙළඳුන්ගේ ග්‍රහනයට හසුව සිටි ඔවුන්ට MI2 මූලික මිරිස් බීජ ලබා ගැනීම නිසා ඉදිරි කන්න සඳහා එමගින් මිරිස් බීජ නිෂ්පාදන වැඩසටහනක් කිරීමටද හැකියාව ලැබිණි.

එමෙන්ම පොළොන්නරුව වී ගොවිපලක් මැතකදී හඳුන්වා දුන් BG 360 (කීරි සම්බා) අත්තිවාරම් බීජ වී බුසල් 5 ක් බීජ වී නිෂ්පාදන වැඩසටහනක් සඳහා ලබා දීමද කරන ලදි. ඊට අමතරව වන සංරක්ෂණ දෙපාර්තුමේන්තුවේ අනුග්‍රහය මත කොස් පැල 500 ක් බෙදා දීමද සිදු කරන ලදි.

තාක්ෂණ ක්‍රියාකාර කමිටුවට ගොවීන් ඇතුලත් කිරීම මගින් ඔවුන්ගේ ගැටළු සඳහා විසඳුම් යෝජනා කිරීමටද අවස්ථාව ලබා දී ඇත. සම්ප්‍රදායික කිරි ඉතිරවීමේ මංගල්‍යයක් ගොවීන් විසින් සංවිධානය කරන ලද අතර අප ආයතනයේ අනුග්‍රහය ඔවුන්ට ලබා දීමද සිදු කරන ලදි.

ඊට අමතරව ස්වයං රැකියා පුහුණු පාඨමාලා හා කෘෂි කාර්මික කටයුතු සඳහා පුහුණු පාඨමාලා පැවැත්වීම කල අතර මෙම වැඩසටහන් වලින් දැනුම වර්ධනය වීමක් සිදුවීම නිසා මෙම ව්‍යාපෘතිය නිසා ඔවුන්ට ප්‍රතිලාභ පවතින බව ගොවීන් තේරුම් ගෙන ඇත.

වගු අංක 3.1

## අලෙවි මාර්ග හා අලෙවිය සම්බන්ධ ගැටළු (මහ)

| අලෙවි මාර්ග | හේතුව | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 01 | | 02 | | 03 | | 04 | | 05 | | 06 | | 07 | |
| | නො | % | නො | % | නො | % | නො | % | නො | % | නො | % | නො | % |
| පෞද්ගලික වෙළෙන්දාට | 13 | 100.00 | 34 | 91.89 | 2 | 66.67 | 27 | 100.00 | 1 | 100.00 | 2 | 100.00 | 0 | 0.00 |
| රජයේ ආයතනයට | 0 | 0.00 | 0 | 0.00 | 1 | 33.33 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| විකුණුවේ නැත | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| පාර්භෝජනය සදහා පමණි | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය | 0 | 0.00 | 3 | 8.11 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| **එකතුව** | **13** | **100.00** | **37** | **100.00** | **3** | **100.00** | **27** | **100.00** | **1** | **100.00** | **2** | **100.00** | **0** | **0.00** |

## අලෙවි මාර්ග හා අලෙවිය සම්බන්ධ ගැටළු (යල)

| අලෙවි මාර්ග | හේතුව | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 01 | | 02 | | 03 | | 04 | | 05 | | 06 | | 07 | |
| | නො | % | නො | % | නො | % | නො | % | නො | % | නො | % | නො | % |
| පෞද්ගලික වෙළෙන්දාට | 8 | 80.00 | 43 | 97.73 | 0 | 0.00 | 15 | 100.00 | 2 | 100.00 | 0 | 0.00 | 2 | 100.00 |
| විකුණුවේ නැත | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| පාර්භෝජනය සදහා පමණි | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය | 2 | 20.00 | 1 | 2.27 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| **එකතුව** | **13** | **100.00** | **37** | **100.00** | **3** | **100.00** | **27** | **100.00** | **1** | **100.00** | **2** | **100.00** | **0** | **0.00** |

01. වැඩි මිල
02. විකිණීමට ඇති එකම මාර්ගය
03. වංචා නැතිකම
04. යෙදවුම් ණයට ගැනීම නිසා
05. දැනහැදුනුම්කම
06. පහසුව සැලසීම
07. වැඩි ව්‍යාපාරික ලාභ

## 3.4 ක්‍රියාත්මක කල සංවර්ධන කටයුතු - අළුත් ගල්කිරියාගම

### 1. පුහුණු පාඨමාලා වැඩ මුළු හා දේශන

ගොවීන් සඳහා පහත සඳහන් පුහුණු පාඨමාලා පවත්වන ලදී.

| වැඩ සටහන | මුදල් / විශේෂඥ සහාය හෝ වෙනත් සහාය ලබාදුන් ආයතන |
|---|---|
| 1. මිරිස් වගාව පිළිබඳව දැනට පවත්නා ගැටළු සහගත තත්ත්වයන් (දේශනයක්) 2002-10-07 | ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය - මහඉලුප්පල්ලම |
| 2. මිරිස් වගාව, වී වගාව, බඩ ඉරිඟු වගාව, කුරක්කන් වගාව, මුං ඇට සහ කව්පි වගාව පිළිබඳ (දින 2 ක පුහුණු වැඩ මුළුවක්) 2003-02-27 සහ 2003-02-28 | ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය - මහඉලුප්පල්ලම<br>බීජ ගොවිපල - මහඉලුප්පල්ලම<br>බීජ සහතික කිරීමේ සේවය - මහඉලුප්පල්ලම<br>මූල්‍ය අනුග්‍රහය හෙ.කො.ගො.ප.පු. ආයතනය |
| 3. ස්වයං රැකියා පුහුණු පාඨමාලාව 2003-05-27 | ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය - අනුරාධපුරය<br>මූල්‍ය අනුග්‍රහය හෙ.කො.ගො.ප.පු. ආයතනය |
| 4. සහල් ආශ්‍රිත නිෂ්පාදනයන්ගේ පුහුණු පාඨමාලාව 2003-08-04 සිට 2003-08-06 දක්වා | පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය - අනුරාධපුරය<br>මූල්‍ය අනුග්‍රහය හෙ.කො.ගො.ප.පු. ආයතනය |

### 2. වගාවන් හා වෙනත් කටයුතු පිළිබඳ ආදර්ශන

පහත සඳහන් වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී.

| වැඩ සටහන | මුදල් / විශේෂඥ සහාය හෝ වෙනත් සහාය ලබාදුන් ආයතන |
|---|---|
| 1. කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය 2003-05-27 | කෘෂිකර්ම උපදේශක - ගොවිජන සේවා මධ්‍යස්ථානය පලාගල |
| 2. පැල තවාන | හෙ.කො.ගො.ප.පු. ආයතනය |
| 3. ශ්‍රී ක්‍රමයට වී වගාව කිරීම | හෙ.කො.ගො.ප.පු. ආයතනය |

### 3. බීජ ඇට හා පැල වර්ග බෙදාදීම

ප්‍රදේශයට අවශ්‍ය බීජ මහ ඉලුප්පල්ලම කෘෂිකර්ම පර්යේෂණ ආයතනයේ බීජ නිශ්පාදන අංශයේ සහාය ඇති වැඩ පිළිවෙලක් දියත් කරන ලදී.

| වැඩ සටහන | මුදල් / විශේෂඥ සහාය හෝ වෙනත් සහාය ලබාදුන් ආයතන |
|---|---|
| 1. MI 2 මූලික බීජ කි.ග්‍රෑම් 3 ලබාදීම | හෙ.කො.ගො.ප.පු. ආයතනය |
| 2. කොස් පැල 500 බෙදා දීම | වන රක්ෂණ දෙපාර්තුමේන්තුව |
| 3.B.G 360 අත්තිවාරම් බීජ බුසල් 5 ක් බෙදාදීම | කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව - අළුත් ගල්කිරියාගම 204/05 ගොවි සංවිධානය |

## 4. අළුතින් ඉදිකිරීම

1. අලෙවි කුටිය
2. අලුත් ගල්කිරියාගම වැඩ පිළිසකර කිරීම (2004 වර්ෂයට නියමිතය)

## 5. සංවිධාන සක්තිමත් කිරීම

ග්‍රාමීය මට්ටමේ පවත්නා සංවිධාන හඳුනාගෙන ඒවා සංවර්ධනය කිරීම සඳහා පහත සඳහන් වැඩ පිළිවෙල ක්‍රියාත්මක කරන ලදී.

| | |
|---|---|
| 1. අළුත් ගල්කිරියාගම 204/05 ගොවි සංවිධානය ශක්තිමත් කිරීම හා දැනුවත් කිරීම | හෙ.කො.ගො.ප.පු. ආයතනය |
| 2. අළුත් ගල්කිරියාගම කාන්තා කුඩා කණ්ඩායම් 4 ක් ශක්තිමත් කිරීම හා දැනුවත් කිරීම | හෙ.කො.ගො.ප.පු. ආයතනය |

## 6. ණය පහසුකම් ලබාදීම

ණය පහසුකම් සඳහා යහපත් ප්‍රවේශයක් නොතිබීම ගොවියන් මුහුණ පෑ ප්‍රධාන ගැටළුවකි.

1. ගොවි ජන බැංකුව හරහා ගොවි සංවිධානයට ණය පහසුකම් ලබා දීම — ගොවිජන සේවා දෙපාර්තමේන්තුව හරහා
2. කෘෂිකාර්මික නිශ්පාදන අලෙවිකිරීම සඳහා සමෘද්ධි බැංකු හරහා ණය ලබාදීමේ වැඩ පිළිවෙල දියත් කිරීම

## 7. ශ්‍රමදාන

පහත සඳහන් ශ්‍රමදාන කටයුතු ක්‍රියාත්මක කරන ලදී.

1. 2003 පෙබරවාරි 04 රුක් රෝපන වැඩ සටහන — ගල්කිරියාගම කොට්ඨාශ කළමණාකරණ කාර්යාලය, හෙ.කො.ගො.ප.පු. ආයතනය
2. පිදුරු කුඹුරුවලට යෙදීමේ ආදර්ශ වැඩ පිළිවෙල

## 8. සංස්කෘතික කටයුතු

ප්‍රදේශයේ සම්ප්‍රදායික සංස්කෘති අංග ඉස්මතු කර ඉදිරියට ගෙන යාම සඳහා කටයුතු කරන ලදී.

1. කිරි ඉතිරවීමේ මංගල්‍යය 2003-03-31 - ගල්කිරියාගම මහවැලි කොට්ඨාශ කළමණාකරණ කාර්යාලය, හෙ.කො.ගො.ප.පු. ආයතනය

## 9. ස්වයං රැකියා

පහත සඳහන් ස්වයං රැකියා වැඩසටහන් 7ක් ක්‍රියාත්මක කරන ලදී.

| වැඩ සටහන | මුදල් / විශේෂඥ සහාය හෝ වෙනත් සහාය ලබාදුන් ආයතන |
|---|---|
| 1. යෝගට් නිෂ්පාදනය | හෙ.කො.ගො.ප.පු. ආයතනය |
| 2. හඳුන් කූරු නිෂ්පාදනය | හෙ.කො.ගො.ප.පු. ආයතනය |
| 3. පපඩම් නිෂ්පාදනය | හෙ.කො.ගො.ප.පු. ආයතනය |
| 4. ලියුම් කවර නිෂ්පාදනය | හෙ.කො.ගො.ප.පු. ආයතනය |
| 5. පුයර නිෂ්පාදනය | හෙ.කො.ගො.ප.පු. ආයතනය |
| 6. අභ්‍යාස පොත් නිෂ්පාදනය | හෙ.කො.ගො.ප.පු. ආයතනය |
| 7. රෙදි පින්තාරු කිරීම | ගල්කිරියාගම මහවැලි කොට්ඨාශ කළමණාකරණ කාර්යාලය |

# හතර වන පරිච්ඡේදය

<u>ව්‍යාපෘති කාර්යන්ගේ බලපෑම හා අරමුණු සඵල කර ගැනීම</u>

අධ්‍යයනයේදී අනාවරණය වූ අයුරින්, පහත සඳහන් බලපෑම් හා ප්‍රතිඵල ගොවි ජනතාව වෙත ලැබුණු බව දැක්විය හැකිය.

## 4.1 ව්‍යාපෘතියෙහි බලපෑම් හා අරමුණ සඵල කර ගැනීම.

මනා සංවිධානාත්මකව ක්‍රියාත්මක කල ස්වයං රැකියා වැඩසටහන පහත සඳහන් බලපෑම් හා ප්‍රයෝජන ලබා දී ඇත.

| පුහුණු පාඨමාලාව | ප්‍රයෝජනය ලත් සංඛ්‍යාව | එම දැනුම භාවිතා කල සංඛ්‍යාව | එහි බලපෑම හා ප්‍රයෝජන |
|---|---|---|---|
| 1. මිරිස් වගාව පිලිබඳ පුහුණු වැඩමුළුව | 12 | 12 | රෝග හා පලිබෝධ පාලනය කර සාර්ථක වගාවන් කිරීම |
| 2. වී වගාව, බඩ ඉරිඟු , කුරක්කන් , මුං ඇට සහ කව්පි වගාව පිලිබඳ පුහුණු පාඨමාලාව | 12 | 12 | රෝග හා පලිබෝධ පාලනය කර සාර්ථක වගාවන් කිරීම |
| 3. පපඩම් නිෂ්පාදනය පිලිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණු පාඨමාලාව | 03 | 03 | කාන්තාවන්ට අතිරේක ආදායම් මාර්ගයක් උත්පාදනය වීම |
| 4. යෝගට් නිෂ්පාදනය පිලිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණු පාඨමාලාව | 03 | 03 | කාන්තාවන්ට අතිරේක ආදායම් මාර්ගයක් උත්පාදනය වීම |
| 5. හඳුන් කූරු නිෂ්පාදනය පිලිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණු පාඨමාලාව | 03 | 04 | කාන්තාවන්ට අතිරේක ආදායම් මාර්ගයක් උත්පාදනය වීම |
| 6. සහල් ආශ්‍රිත නිෂ්පාදනය පිලිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණු පාඨමාලාව | 04 | | තවමත් නිෂ්පාදන කටයුතු ආරම්භ කර නැත |

## 4.2. බීජ / පැල බෙදාදීම

බීජ වර්ග හා පැල බෙදාදීම මගින්, ස්වයං බීජ නිෂ්පාදනය සඳහා ගොවියන් හා ගොවි කණ්ඩායම් සතු ශක්තිය අවබෝධ කර ගන්නා ලදී.

| බීජ නිෂ්පාදන වැඩ සටහන | ප්‍රතිලාභීන් | එහි බලපෑම හා ප්‍රයෝජන |
|---|---|---|
| 1. මිරිස් බීජ කි.ග්‍රෑම්. 3 | 20 | 1 මෙම ප්‍රදේශයේ පවතින ප්‍රධාන ගැටළුවක් වන ගුණාත්මක බීජ ගැටළුවට විසඳුම් ලැබීම<br>2 අත්තිවාරම් බීජ හෙයින් කන්න කිහිපයක්ම භාවිතා කල හැකි වීම |
| 2. බීජ වී කි.ග්‍රෑම්. 100 | 13 | 1 මෙම ප්‍රදේශයේ පවතින ප්‍රධාන ගැටළුවක් වන ගුණාත්මක බීජ ගැටළුවට විසඳුම් ලැබීම<br>2 අත්තිවාරම් බීජ හෙයින් කන්න කිහිපයක්ම භාවිතා කල හැකි වීම |
| 3. කොස් පැල 500 | 60 | 1 මෙම ප්‍රදේශයේ පවතින ප්‍රධාන ගැටළුවක් වන ගුණාත්මක බීජ ගැටළුවට විසඳුම් ලැබීම<br>2 අත්තිවාරම් බීජ හෙයින් කන්න කිහිපයක්ම භාවිතා කල හැකි වීම |

## 5 අළුතින් ඉදිකිරීම්

අලෙවි කුටිය ඉදි කිරීම ගොවි සංවිධාන සාමාජිකයින් 98% කගේ ප්‍රබල ඉල්ලීම මත ක්‍රියාත්මක කරන වැඩ සටහනකි.

| අළුතින් ඉදිකිරීම් | ප්‍රතිලාභීන් | එහි බලපෑම හා ප්‍රයෝජන |
|---|---|---|
| 1. අලෙවි කුටිය | 123 | මෙම ඉදිකිරීම් කටයුතු සිදු කෙරෙමින් පවතී. ප්‍රදේශයේ ගොවීන්ට තම නිෂ්පාදන වැඩි මිලකට අලෙවි කර ගැනීමටත් පාරිභෝගිකයින්ට පහසු මිලකට නිෂ්පාදන මිලයට ගැනීමට පහසුකම් ලැබීම. |
| 2. වැව ප්‍රතිසංස්කරණය | 123 | 2004 වර්ෂයට යොදා ඇත. |

## 6 සංවිධාන ශක්තිමත් කිරීම

සංවිධාන ශක්තිමත් කිරීම ගොවියන්ගේ එකමුතුකම ශක්තිමත් කිරීම මෙහිදී මූලික අරමුණ විය.

| සංවිධානය | සහභාගී වූ ගොවීන් | එහි බලපෑම හා ප්‍රයෝජන |
|---|---|---|
| 1. ගොවි සංවිධානය | 70 | ආදර්ශන හා පුහුණු වැඩසටහන් බීජ සපයාදීම් ණය පහසුකම් සපයාදීම් නිසා සාර්ථක ලෙස වගා කටයුතු කරගෙන යෑමට හැකියාව ලැබීම |

## 7 ණය පහසුකම්

කෘෂි කාර්මික නොවන කටයුතු සඳහාඅඩු ආදායම්ලාභී ගොවි පවුල්වලට යහපත් පිවිසුමක් නොතිබීම ප්‍රබල ගැටළුවක් ලෙන ගොවියන් පෙන්වා දුනි.

| ණය පහසුකම් | සහභාගී වූ ගොවීන් | එහි බලපෑම හා ප්‍රයෝජන |
|---|---|---|
| 1. ණය පහසුකම් ගොවි බැංකුව හරහා | ප්‍රතිලාභීන් 40 | 1. කලට වේලාවට යෙදීමේ හැකියාව<br>2. ගමේ වෙළෙන්දාට ණය ගැති නොවීම<br>3. අඩු පොළී අනුපාතයක් ගෙවීමට සිදුවීම<br>4. අවසානයේ සාර්ථක අස්වැන්නක් ලබා ගැනීම<br>5. ගමේ වෙළෙන්දාට ණය ගැති නොවීම නිසා තමා කැමති වෙළෙන්දෙකුට වැඩි මිලකට අස්වැන්න අලෙවි කිරීම |

## ශ්‍රමදාන කටයුතු

ශ්‍රමදාන කටයුතු මගින් ගොවියන්ගේ අවශ්‍යතා බොහොමයක් අඩු පිරිවැයක් යටතේ ඔවුන්ටම කරගත හැකි බව මෙම වැඩසටහන් මගින් මනාව පිළිබිඹු කර ඇත.

| ශ්‍රමදාන කටයුතු | සහභාගී වූ සංඛ්‍යාව | ප්‍රතිඵලය | |
|---|---|---|---|
| වන වගා වැඩසටහන | 75 | පරිසරය සුරැකීම | නිදහස් දින සැමරුමක් අවසානයේ ශ්‍රමදානය පැවැත්වීම නිසා එකමුතුකම ජාතික හැඟීම ඇතිවීම |

**සංස්කෘතික කටයුතු**

ප්‍රදේශයේ සම්ප්‍රදායික සංස්කෘතික කටයුතුවලට නව ජීවයක් දීම තුලින්, එකමුතුව වැඩකිරීමේ පුරුද්ද ගොවියන් තුල නැමත ඇති කල හැකි විය.

| කිරි ඉතිරවීමේ මංගල්‍යය | සහභාගී වූ සංඛ්‍යාව | ප්‍රතිඵලය | වක්‍ර ප්‍රතිඵලය |
|---|---|---|---|
| කිරි ඉතිරවීමේ මංගල්‍යය (ගරු නියෝජ්‍ය කෘෂිකර්ම ඇමති මුත්තු සිවිලිංගම් මැතිතුමාගේ සහභාගීත්වයෙන් ) | 100 | අස්වනු නෙලීමෙන් පසු දේවාශිර්වාද ලබා ගැනීම ගොවීන් අතර එකමුතුකම ඇතිවීම | අභාවයට යන සම්ප්‍රදායික චාරිත්‍ර විධි නැවත ආරම්භ කිරීම |

වඩා පුළුල් වශයෙන් බැලීමේදී, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී, ද්වි ආකාර අරමුණු පද්ධති කෙරේ වඩා අවධානය යොමු විය. විස්තර වශයෙන්,

1. කෙටි කාලීන ව්‍යාපෘති අරමුණු සහ
11. දිගු කාලීන ව්‍යාපෘති අරමුණු වශයෙන් ද්වි ආකාර වුව ද, ආරම්භක අවස්ථාවේදී කෙටි කාලීන අරමුණු කෙරේ ව්‍යාපෘති සැලසුම් වැඩි අවධානය යොමු කරන ලදී.

## 4.2.1 කෙටි කාලීන ව්‍යාපාති අරමුණු

කෙටිකාලීන අරමුණුවලදී ගොවියන් සතු ස්වභාවික සම්පත් හා ශ්‍රමබලය මනාව හැසිරවීම මගින් ඵලදායිතාවය හා ආදායම වැඩි කර ගැනීමට රුකුල් දීම ප්‍රධාන ප්‍රවේශය විය.

### 1. ඵලදායීතාවය වර්ධනය කිරීම

මෙම ගම්මානයේ හඳුනා ගන්නා ලද ප්‍රධානතම ගැටළු අතර උපදෙස් හා තාක්ෂණ සේවා නොමැතිකම, ගුණාත්මක බීජ වර්ග නොමැතිකම හා කෘෂි කාර්මික ණය ලබා ගැනීමේ අපහසුකම යන ගැටළු, ඵලදායීතාවය හා අනුලෝම වශයෙන් සම්බන්ධවේ. ව්‍යාපාතියේ ආරම්භක සැලසුම් සකස් කිරීමේදී මේ සඳහා වැඩි අවධානයක් යොමු කරන ලදි. ගුණාත්මක වැඩි දියුණු කරන ලද බීජ වර්ග සැපයීම තුලින්ද කෘෂි කර්ම දෙපාර්තුමේන්තුවේ නිලධාරීන් විසින් උපදෙස් හා තාක්ෂණ සේවා සැපයීම තුලින්ද ගොවි ජන සේවා දෙපාර්තුමේන්තුව සම්බන්ධවී ගොවි ජන බැංකුව හරහා ණය සැපයුම තුලින් ද ඉහත ගැටළු වලට විසඳුම් ලබා දෙන ලදි. ඊට අමතරව පලාගල කෘෂි කර්ම උපදේශකවරයා විසින් කාබනික පොහොර නිෂ්පාදනය පිලිබඳ ආදර්ශනය කරන ලදි. ප්‍රදේශයේ ගිනි තබා විනාශ කරනු ලැබූ පිදුරු මින් මතු ගිනි නොතබා කුඹුරු වලට යෙදීමට උපදෙස් ලබා දුන් අතර කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනයේදී අමු ද්‍රව්‍යයක් වශයෙන් පිදුරු භාවිතයද ගොවීන්ට හඳුන්වා දෙන ලදි. එමෙන්ම ශ්‍රී වගා ක්‍රමය ගොවීන්ට හඳුන්වා දී ආදර්ශන වගා කිහිපයක්ද කරන ලදි. මේ ආකාරයට ඵලදායීතාවය වර්ධනය කිරීමේ අරමුනින් වැඩ සටහන් රාශියක් ගොවීන්ට හඳුන්වා දෙන ලදි.

### 11. රැකියා වර්ධනය කිරීම

රැකියා අවස්ථා උත්පාදනය කිරීම සඳහා ස්වයං රැකියා පුහුණු පාඨමාලා පවත්වා කාන්තා කුඩා කණ්ඩායම් වල ගෙවිලියනට රු 10000/= ක මූල්‍ය ආධාරයක්ද කරන ලදි. ඒ අනුව

1. හඳුන් කූරු නිෂ්පාදනයට ගෙවිලියන් 5 ක් ද
2. පුයර නිෂ්පාදනයට ගෙවිලියන් 18 ක් ද
3. ලියුම් කවර නිෂ්පාදනයට ගෙවිලියන් 10 ක් ද
4. පපඩම් නිෂ්පාදනයට ගෙවිලියන් 3 ක් ද
5. යොගට් නිෂ්පාදනයට ගෙවිලියන් 3 ක් ද
6. පැල තවාන් වැඩ සටහනට ගෙවිලියන් 10 ක් ද සම්බන්ධ වී ඇති අතර
7. අභ්‍යාස පොත් නිෂ්පාදනයට එක් ගොවි මහතෙකුද සම්බන්ධ වී නිෂ්පාදන කටයුතු කරනු ලැබේ.

ඊට අමතරව ප්‍රදේශයේ පාසල් හැරගිය තරුණයන් 4 දෙනෙකුට සහල් ආශ්‍රිත නිෂ්පාදන පිලිබඳ පුහුණුවක් ලබා දුන්නද නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට විශාල ප්‍රාග්ධනයක් වැය කිරීමට සිදුව ඇති හෙයින් තවමත් ව්‍යාපාර කටයුතු ආරම්භ කර නැත.

## 111. ආදායම් වැඩි කිරීම

නිෂ්පාදනය ඉහල නැංවීම හා නිෂ්පාදන වියදම් අඩු කිරීම තුලින් කෘෂි කාර්මික කටයුතු වලින් ආදායම් වැඩි කිරීමේ වැඩ සටහනක් ව්‍යාපෘතිය තුලින් ක්‍රියාත්මක කරන ලදි. කාබනික පොහොර භාවිතය කෘෂි රසායන අවම වශයෙන් භාවිතාව කන්නයට එක්වර සියල්ලම වගා කටයුතු කිරීම මනා ජල පාලනය වැඩි දියුණු බීජ භාවිතය ආදී කෘෂි දෙපාර්තුමේන්තුවේ නිලධාරීන්ගේ උපදෙස් මත වගා කර ගනු ලබන අස්වැන්න වැඩි මිලකට අලෙවි කිරීම මගින් ආදායම් වැඩි කිරීමට කටයුතු කරන ලදි. එමෙන්ම වී වගාව වෙනුවට වැඩි ආදායම් ලැබිය හැකි මිරිස් එලවළු වැනි බෝග වගාවන්ට ගොවීන් හුරු කිරීමද කරන ලදි. තවද, කෘෂි කර්ම දෙපාර්තුමේන්තුවේ මහ ඉලුප්පල්ලව බීජ ගොවි පලට අවශ්‍ය වන බීජ මෙම ගම්මානයේ ගොවීන් ලවා නිෂ්පාදනය කර වැඩි මිලකට මිලට ගැනීමට කටයුතු 2003 යල කන්නය ආරම්භයේදී සිදු කරන ලදි. මේ අනුව කව්පි කි.ග්‍රෑම් 1 ක් රු 70 බැගින්ද සෝයා කි.ග්‍රෑම් 1 ක් රු 45 බැගින්ද කුරක්කන් කි.ග්‍රෑම් 1 ක් රු 35 බැගින්ද මහ ඉලුප්පල්ලම බීජ ගොවි පල මිලයට ගැනීමට කටයුතු කරන ලදි. මේ සඳහා අවශ්‍ය වන බීජ කෘෂි කර්ම දෙපාර්තුමේන්තුව මගින් ගොවීන්ට මුදලට ලබා දෙන අතර තාක්ෂණික උපදෙස් හා ගොවි පල ලියාපදිංචි කිරීම නොමිලේ කරදේ.මේ පිලිබඳව පුහුණු වැඩ සටහනක් ගොවීන්ට ලබාදුන් නමුත් 2003 යල කන්නයේදී වාරි මාර්ග පුනරුත්ථාපන කටයුතු නිසා වගා කටයුතු වලට ජලය ලබා නොදීමේ හේතුවෙන් මෙම වැඩ සටහන අතර මග නවතා දැමීමට සිදුවිය.

අළුත් ගල්කිරියාගම ව්‍යාපෘති බල ප්‍රදේශයේ මිරිස් ඇතුළු අනෙකුත් අතිරේක බෝග වගා කරනු ලබන්නේ යල කන්නයේදී වන අතර මහ කන්නයේදී වී පමණක් කුඹුරු බිම් වල වගා කරනු ලබයි. 2003 යල කන්නයේදී වගා කටයුතු වලට ජලය ලබා නොදීමේ හේතුව නිසා ව්‍යාපෘතිය ආරම්භ කිරීමෙන් පසු එකම යල කන්නයක් වත් වගා කටයුතු කිරීමේ හැකියාවක් නොලැබිණි. 2003 යල කන්නයේදී වගා කිරීම සඳහා 2002/03 මහ කන්නයේ නිෂ්පාදනය කර ගනු ලැබූ මිරිස් බීජ 2003/04 මහ කන්නයේ ගොඩ බිම් වල වගාවන් සඳහා භාවිතා කර ගනු ලැබිණි. 2003 යල කන්නයේ ජලය ලබා නොදීම ව්‍යාපෘතියේ සංවර්ධන වැඩ සටහන් වලට විශාල බාධකයක් විය.

## 4.2.2 දිගු කාලීන අරමුණු ඉටු වීම

දිගුකාලීන අරමුණුවලදී ප්‍රදේ ශයේ ආර්ථික හා සමාජ සම්පත් හා පාරසරික සංරක්ෂණ අවශ්‍යතාවයක් මානුෂ ක්‍රියාකාරකම් වලදී සැලකිල්ලට ගැනීම හා එහි තිරසාර බව තහවුරු කිරීම සඳහා වූ වැඩසටහන් කෙරේ අවධානය යොමු විය. ගම්මානයේ ගොවීන් හට කෘෂි යෙදවුම් සහ තාක්ෂණික දැනුම ලබා දීම මගින් නිෂ්පාදන ඉහල යාමත්, ස්වයං රැකියා ආරම්භ කිරීමෙන් පසු අතිරේක ආදායම් මාර්ග උත්පාදනය වීමත් නිසා කෙටි කාලීන මෙන්ම දිගු කාලීන වශයෙන්ද ව්‍යාපෘතියේ අරමුණු ඉටු වනු ඇත.

මෙහිදී ප්‍රධානම අවධානය යොමුවීමේදී, ආර්ථික කටයුතු වලදී සාමූහිකව හා පොදු හැඟීමෙන් එකී කටයුතු සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා ප්‍රතිඵල / ප්‍රතිලාභ සාධාරණ ලෙස සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම උපායන් කෙරේ වඩා නැඹුරුවීම යන ලක්ෂණ කෙරේ ප්‍රජාව වඩ වඩා නැඹුරු කිරීමය.

# පස්වන පරිච්ඡේදය

මෙම පරිච්ඡේදයේදී තිරසාර සංවර්ධන ගම්මාන ව්‍යාපෘතිය යටතේ, ව්‍යාපෘති සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී හා ක්ෂේත්‍ර අධ්‍යයන වලදී ලබා ගත් අත්දැකීම් හා තොරතුරු සැකෙවින් හා ලුහුඩින් ඉදිරිපත් කෙරේ.

**අධ්‍යයන හා නිරීක්ෂණ ඇසුරින් සොයා ගත්, පාඩම්, අත්දැකීම්, හා ගැටළු**

## 5.1 සොයා ගැනීම්

### 1. ගොවීන් මූල්‍යමය හෝ ද්‍රව්‍යමය ආධාර බලාපොරොත්තු වීම

අළුත් ගල්කිරියාගම ගම්මානය ගොවි ජනපදයකි. එම ගම්මානයේ ඉඩම් ලබාදීමේදී එම ප්‍රදේශයේ එතෙක් වාසය කල ජනතාවට මෙන් වෙනත් ප්‍රදේශ වලින් පැමිනි ජනතාවටද කුඹුරු අක්කර 21/2 ක් සහ උස් බිම් අක්කර 1/2 ක් ලබා දී ඇත. නමුත් මේ වන විට දෙවන පරම්පරාවක් ඇති වීම සහ ඉඩම් වල ඵලදායීතාවය යම් තරමකට ඉහල ගොස් තිබුනද නිෂ්පාදන වියදම අධික වීමත් අලෙවි ගැටළු පැවතීම නිසාත් ලාභ ප්‍රතිශතය පහල මට්ටමක පැවතීමෙන් නිසා ආර්ථික දුෂ්කරතාවලට මුහුණ පෑමට සිදුව ඇත. මෙම නිසා ඔවුන් ක්ෂණික ප්‍රතිලාභ බලාපොරොත්තුවේ. විශේෂයෙන් ඔවුන් කිසියම් ව්‍යාපෘතියකදී මූලමය හෝ ද්‍රව්‍යමය ප්‍රතිලාභ බලාපොරොත්තුවේ.

### 11. මෙවැනි ව්‍යාපෘතියකදී කාන්තාවන් වැඩි උනන්දුවක් හා සහභාගීත්වයක් දැක්වීම

මෙම ව්‍යාපෘතියේදී කාන්තාවන්ගේ සහභාගීත්වය කැපී පෙනෙන ලක්ෂණයක් විය. විශේෂයෙන්ම ස්වයං රැකියා වැඩ සටහනේදී එක් පිරිමියෙකු හැරුනු විට දායකත්වය දැක්වූයේ කාන්තාවන්ය. සබන් නිෂ්පාදනය සඳහා පුහුණු ලාභීන් වශයෙන් පිරිමින් දෙදෙනෙකු තෝරා ගෙන තිබුනද ඔවුන් ඒ සඳහා සහභාගී වූයේ නැත. යෝගට්, හඳුන් කූරු සහ පපඩම් නිෂ්පාදනය සඳහා තෝරා ගත් සියළුම කාන්තාවන් පුහුණුවට සහභාගීවිය. මෙයට හේතුව වී ඇත්තේ ගෙදර දොර අවශ්‍යතා සඳහා අමතර ආදායමක් උපයා ගැනීමට පිරිමින්ට වඩා කාන්තාවන්ට අවශ්‍යවීමයි.

### 111. ගොවීන්ට උපදෙස් හා ආධාර ලබා දීම තුලින් ඔවුන්ගේ ආකල්ප වෙනස් කල හැකි බව

ව්‍යාපෘතිය ආරම්භ කරන සමය විට මෙම ප්‍රදේශයේ මිරිස් වගාවෙන් ගොවීන් ඉවත්වී සිටියහ. රෝග හා පලිබෝධ නිසාත් අලෙවි ගැටළු පැවතීමත් එයට හේතු වී තිබිණ. මේ සඳහා ඔවුනට මහ ඉලුප්පල්ලම කෘෂි කර්ම ශෂ්‍ය විද්‍යාඥයකු විසින් මුලින්ම මිරිස් වගාව පිලිබඳ දේශනයක් පවත්වා මූලික දැනීමක් ලබා දෙන ලදි. ඉන්පසු බීජ නිෂ්පාදන වැඩ සටහනක් කිරීම සඳහා ඔවුන්ට M.I 2 මූලික මිරිස් බීජ කි.ග්‍රෑම් 3 ක් ලබා දෙන ලදි. මෙමගින් 2002/2003 මහ කන්නයේසාර්ථක බීජ නිෂ්පාදන වැඩ සටහනක්

ක්‍රියාත්මක කරන ලදි. ඉතාම උසස් තත්ත්වයේ මෙවැනි මිරිස් බීජ පසුගිය අවුරුදු 25 ක අතීතයේ ඔවුනට ලැබී තිබුනේ නැත.

### 1V. ගොවීන් තම අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා උද්ඝෝෂණ හා වෙනත් විවිධ ක්‍රියා මාර්ග අනුගමනය කිරීමට නැඹුරු වීඇති බව

මේ සඳහා උදාහරණයක් වශයෙන් 2003 යල කන්නයේදී වගා කටයුතු වලට ජලය ලබා නොදීමේ හේතුව නිසා පානීය හා ස්නානය සඳහා ඔවුන්ට ජලය පිළිබඳ ගැටළුවක් මතු විය. මෙහිදී ඔවුන් කරනු ලැබූයේ මහවැලි කොට්ඨාශ කළමණාකරණ කාර්යාලය වටලා උද්ඝෝෂණ ව්‍යාපාරයක් දියත් කිරීමයි. මෙහිදී ඔවුන්ගේ ඉල්ලීම් ජයග්‍රහනය කරන ලදි.

දෙවැනි උදාහරණය වශයෙන් මෙම ව්‍යාපෘතිය මගින් ඉදිකිරීමට යෝජිතව තිබූ අලෙවි කුටිය සඳහා මුදල් ලබාදීම ප්‍රමාද වීම පිළිබඳව ගොවි සංවිධානය විසින් අප අධ්‍යක්ෂතුමාගෙන් සහ ක්ෂනික ඇමතුම් සේවයෙන් විමසීමක් කිරීම දැක්විය හැකිය. එමෙන්ම ඔවුන් මේ වන විට සම්ප්‍රදායික ගොවීන් මෙන් රාජ්‍ය නිලධාරීන්ට අවනත වීමක් දක්නට නොහැක.

## 5.2 පාඩම් හා අත්දැකීම්

ස්වයං රැකියා වැඩ සටහනේදී වෙළඳ පල පිළිබඳව සොයා නොබලා කුඩා කණ්ඩායම් වලට සම්බන්ධ කාන්තාවන්ගේ ඉල්ලීම පරිදි හඳුන් කූරු, ලියුම් කවර හා පුයර නිෂ්පාදනය ආරම්භ කරන ලදී. මේ සඳහා වෙළඳ පලක් නොමැති වීම නිසා තවදුරටත් පවත්වා යාමේ ගැටළුවක් මතු විය.

**මෙම ප්‍රදේශයේ ගෙවතු වන වගා හැරුණු විට වෙනත් වන වගා කිරීමට ඇති අසීරු තාවය**

මෙම ප්‍රදේශයේ සමහර කාල වලදී එක දිගට මාස 4-5 ක කාලයක් නියඟය පවතී. අප ව්‍යාපෘතිය විසින් වන රක්ෂණ දෙපාර්තුමේන්තුව මගින් නොමිලයේ ලබා ගන්නා ලද කොස් පැල 500 න් 250 ක් රජයේ රක්ෂිතයක පෙබරවාරි 04 දින ශ්‍රමදානයක් මගින් රෝපනය කරන ලදි. පසු ගිය යල කන්නයේ පැවති දැඩි නියඟය සමග එම පැල සියල්ල විනාශ වී යාමක් සිදුවිය.

## 5.3 ප්‍රශ්න හා ගැටළු

### 1. වාරි කළමණාකරණ ගැටළු - ජල සැපයුම නිකුත් කිරීම හා 2003 යල කන්නයේ වගා කටයුතු නොකිරීම

අප ව්‍යාපෘතිය සඳහා පැවති ලොකුම ප්‍රශ්නය හා ගැටළුව වූයේ 2003 යල කන්නයේදී වගා කටයුතු වලට ජලය ලබා නොදීමයි. මෙම ප්‍රදේශයේ ආර්ථික බෝග වගාව කුඹුරු වල කරනුයේ යල කන්නයේ හෙයින් එම කන්නයේ කිසිදු වගා කටයුත්තක් කිරීමට නොහැකි විය. අප ව්‍යාපෘතිය ආරම්භ කර කන්න 3ක් ගත වූවත් එකම යල කන්නවත් අප ව්‍යාපෘතිය සම්බන්ධව වගා කිරීමට අවකාශ නොලැබිණි. එම

හේතුව නිසාම 2003 යල කන්නය වෙනුවෙන් ක්‍රියාවට නැංවීමට නියමිතව තිබූ විශේෂිත සංවර්ධන වැඩ සටහන් ගනනාවක්ම අතහැර දැමීමට සිදුවිය. 2003 යල කන්නයේදී වගා කටයුතු නොකිරීම නිසා 2003/04 මහ කන්නයේ වගා කටයුතු කර ගැනීමට ඔවුන්ට ප්‍රාග්ධන හැකියාවක් නොමැති වීමක් සිදුව තිබේ.

## 11. ගොවීන්ගේ සහභාගීත්ව අඩුකම

මහවැලි ගොවි ජන පදයක ගොවි සංවිධානයේ නිලතලයක් දැරීම විවිධ ප්‍රතිලාභ ලබා දෙන තනතුරක් බවට මේ වන විට පත්ව ඇත. ගොවි සංවිධානය මගින් රුපියල් මිලියන ගනනින් කොන්ත්‍රාත් කටයුතු කරනු ලබයි. මෙහිදී සභාපති තනතුර විශේෂයෙන්ම කැපී පෙනෙන තනතුරක් බවට පත්ව ඇත. මෙම ප්‍රදේශයේ දේශපාලන බලපෑම් ගොවි සංවිධානයට නොමැති වුවත් ගොවි සංවිධානයේ නිලතල සඳහා කන්ඩායම් 2 ක් තරඟ වැදීම නිසා ගොවීන් කන්ඩායම් 2කට බෙදී පවතී. මෙහිදී පරාජයට පත්වූ ගොවි කණ්ඩායම ගොවි සංවිධානයේ කටයුතු වලින් දුරස් වී සිටීම අපට දක්නට හැකිවූ එක් ගැටළුවකි. නමුත් පසුව ව්‍යාපෘතියට සම්බන්ධ ගොවි මහතුන් ලබන ප්‍රතිලාභ නිසා ඔවුන් ද යම් නැඹුරුවක් දක්වන ලදී.

## 111. පාරම්පරික ගොවීන් සහ ආගන්තුක ගොවීන් අතර පැවති යම් යම් ගැටළු

මෙම ප්‍රදේශයේ සිටි පාරම්පරික ගොවීන් හා වෙනත් ප්‍රදේශවලින් පැමිණි ඉඩම්ලාභී ගොවීන් අතර ද යම් යම් ගැටළු පැවතිනි. විශේෂයෙන්ම මේ වනවිට ආගන්තුක ගොවීන් ගොවි සංවිධාන වලින් මෙන්ම වෙනත් ක්‍රියාකාරකම් වලදී ඉදිරියෙන්ම සිටී.

## IV. ග්‍රාමීය නිලධාරීන් අතුරෙන් සමෘද්ධි සංවර්ධන නිලධාරීවරයා අප ව්‍යාපෘතියට සම්බන්ධ නොවීම

මහවැලි ක්ෂේත්‍ර සහකාරවරිය, කෘ.ප.නි.ස.නිලධාරීවරිය හා ග්‍රාම නිලධාරීවරයා ඉහත ව්‍යාපෘතියේ කටයුතුවලට පූර්ණ සහයෝගය ලබා දුන්නද විශාල වැඩ කොටසක් කිරීමට හැකියාව පැවති සමෘද්ධි සංවර්ධන නිලධාරීවරයා එම කටයුතු සඳහා දායකත්වය සැපයීම නොකරන ලදී. මොහු වෙනත් ප්‍රදේශයක පදිංචිකරුවෙකු වූ අතර කිසිම දිනක ඔහුගේ කාර්යාලයේදී හමුවීමට අප හට නොහැකි විය.

## V. වල් අලි උවදුර මැඩලීමට නොහැකිවීම

මෙම ප්‍රදේශයේ වගා කටයුතුවලට බලපානු ලබන ප්‍රධාන බාධකයක් වනුයේ වල් අලි උවදුරයි. සමහර කාලවලදී 50 - 75 පමණ රංචු මෙම ගම්වලට කඩා වදී. වනජීවී නියාමක කාර්යාලයක් මහවැලි ගල්කිරියාගම කොට්ඨාශ කලමණාකරන භූමියේම පිහිටා ඇතත් ඔවුන්ට ඒ පිලිබඳව කල හැකි යමක් නැත. මේ සඳහා කල හැකි එකම විසඳුම වන්නේ විදුලි වැටක් සවිකිරීම පමණකි.

## V1. ගබඩා පහසුකම් මදකම

සම්ප්‍රදායික වී අටු ක්‍රමය නැවත පුනරුත්තාපනය කිරීමේ ක්‍රමය යෝජනා වුවද, එය ක්‍රියාත්මක කිරීම ආශ්‍රිත ගැටළු ඇත.

## V1. අලෙවි කටයුතු ආශ්‍රිත ගැටළු

දැනට පවත්නා අලෙවි සම්බන්ධතා හා අලෙවි ක්‍රම (Marketing Channels and Marketing System) ආශ්‍රිත ගැටළු හඳුනා ගැනීම සඳහා ක්‍රමවත් විධි ක්‍රමයක් නැතිකම ද ප්‍රබල ගැටළුවකි.

# හයවන පරිච්ඡේදය

## නිගමන හා යෝජනා

### 6.1 නිගමනය

යම් යම් බාධක හා ගැටළු මැඩ පවත්වමින් මෙවැනි ව්‍යාපෘතියක් සාර්ථකව ක්‍රියාත්මක කල හැකි බවට නිගමනය කල හැකිය. නමුත් එය වසරකින් හෝ දෙකකින් කල හැක්කක් නොවේ. දිගුකාලීන අරමුණු ඉටුකර ගැනීම සඳහා අවම වශයෙන් වසර 5 ක් වත් දියත් කල යුතු ය.

දේශපාලන සබඳතා නොමැතිව මෙවැනි ව්‍යාපෘති ගම්වල ක්‍රියාත්මක කල හැකිය. මෙම ව්‍යාපෘතිය ආරම්භයේ සිට මේ දක්වා කිසිම ක්‍රියාවලියකදී කුමන හෝ දේශපාලන පක්ෂයක අවම වශයෙන් ප්‍රාදේශීය මට්ටමේ හෝ නායකයකු සම්බන්ධ කර නොගන්නා ලදී. අප ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන ගොවි සංවිධානයේ සභාපති හා භාණ්ඩාගාරික ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකට සම්බන්ධ පුද්ගලයන් දෙදෙනෙකු වීම ව්‍යාපෘතිය කරගෙන යාමේදී යම් පහසුවක් අපහට ඇති විය. මේ හේතුව නිසාම කිසිදු අවස්ථාවක රාජ්‍ය නිලධාරින් හැරුණු විට කිසිදු පක්ෂයක දේශපාලන නායකයෙකුට සම්බන්ධ කර නොගන්නා ලදී.

### 6.2 යෝජනා

1 මහවැලි අධිකාරිය විසින් මෙතෙක් ගොවීන්ට සපයන ලද සේවය ඉදිරියේදි ගොවි සම්මේලන හරහා ක්‍රියාත්මක කිරීමේ වැඩ පිළිවෙලක් පවතී. ගොවි සංවිධාන මෙන්ම ගොවි සම්මේලනද විවිධ බලපෑම් ඇති අර්බුදකාරී වාතාවරණයක් පවතින ආයතන වේ. මහවැලි අධිකාරිය යටතේ වුවද මෙම ජනපදවල කටයුතු පවත්වාගෙන යනු ලබන්නේ අපහසුතා මධ්‍යයේය. එමනිසා මෙවැනි ව්‍යාපෘතියකින් රාජ්‍ය නිලධාරින් ඉවත්වීම තුලින් ව්‍යාපෘතියේ තිරසරභාවය පිළිබඳව සැක සහිතය. ග්‍රාමීය නිලධාරින්ට ප්‍රතිලාභ නොපවතින හෙයින් ඔවුන් තවදුරටත් එම කාර්යයයේ නියැලී සිටීම සැක සහිත වේ.

මෙම ව්‍යාපෘතිය තවමත් තිරසාර තත්ත්වයක නොපවතින හෙයින් අප ආයතනයේ අධීක්ෂණය මත ග්‍රාමීය නිලධාරින් වන කා.ප.නි.ස. වරියගේ ක්ෂේත්‍ර සහකාර නිලධාරිවරියගේ සහ ග්‍රාම නිලධාරිවරයාගේ සේවය තවදුරටත් ලබා යම් කිසි මූල්‍යමය ප්‍රතිලාභයක් ඔවුන්ට ලබාදීම යෝග්‍ය වේ. අප ව්‍යාපෘතියේ කටයුතුවලින් බැහැර වී සිටින සමෘද්ධි සංවර්ධන නිලධාරිවරයා ස්ථාන මාරු වීමක් කර වෙනත් කාර්යක්ෂම නිලධාරිවරයෙකු මෙම ගම්මානයට පත්කර ගත යුතුය. ඊට අමතරව ව්‍යාපෘතියේ කටයුතුවලට සම්බන්ධ වන වෙනත් රාජ්‍ය ආයතන නිලධාරින්ටද ගමන් වියදම් දීමනාවක් ලබා දීම මගින් ඔවුන්ගේ වැඩි කාර්යක්ෂමතාවයක් ලබා ගත හැකි වේ.

2 මෙම ව්‍යාපෘතියේදී අප සැලසුම් සම්බන්ධ කර එකම යල කන්නයක්වත් වගා කිරීමට නොහැකි වූ නිසා තවත් යල කන්න 2ක් වත් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මගින් අපගේ ඉලක්කය සපුරා ගැනීමට හැකි වේ.

3 අප ව්‍යාපෘතිය මගින් පාසල් හැර ගිය තරුණයන් සිව් දෙනෙකුට සහල් ආශ්‍රිත නිෂ්පාදනයන් පිලිබඳව ප්‍රායෝගික හා න්‍යායන් මත පුහුණුවෙන් පශ්චාත් අස්වැන්න පිලිබඳ තාක්ෂණ ආයතනයේදී ලබා දෙන ලදී. එම නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීම සඳහා විශාල ප්‍රාග්ධනයක් දැරීමට සිදුවන අතර බැංකු ණය ලබා ගැනීමේදී ද සුරැකුම් පිලිබඳ ගැටළු පවතී.

මේ සඳහා සහන පොලී පදනමක් මත ඔවුනට පහසු ණය ක්‍රමයක් ලබා දීමට කටයුතු කල යුතු ය. මේ කර්මාන්තය සඳහා අධීක්ෂණ මණ්ඩලයක් පත්කර දැනට මහවැලි අධිකාරිය සතු ගබඩාවක් ප්‍රතිසංස්කරණය කර නිෂ්පාදන කටයුතු ආරම්භ කල හැකිය. මෙමගින් දෙවන පරම්පරාව සඳහා රැකියා අවස්ථා උත්පාදනය වීමත් වන අතරම ප්‍රදේශයේ ප්‍රධාන කෘෂි නිෂ්පාදනය වන වී අලෙවිය පිලිබඳ ගැටළුවටද විසඳුමක් නිර්මාණය වේ. මෙමගින් ක්ෂණික ඉඳි ආප්ප පිටි, ක්ෂණික ආප්ප පිටි සහල් නූඩ්ල්ස් සහ ගුණාත්මක සහල් නිෂ්පාදනය කල හැකි වේ. ඒ සඳහා වෙලඳපොලක් ද මේ ප්‍රදේශයේ මෙන්ම පිට ප්‍රදේශවලද පවතී.

4 අලෙවි ගැටළු සම්බන්ධයෙන් ගොවි සංවිධාන හා ගොවි සංවිධාන බල මණ්ඩලය මගින් කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවි කිරීමේ වැඩ පිළිවෙලක් සකස් කිරීමේ හැකියාව අධ්‍යයනය කිරීම.

5 කෘෂිකාර්මික නොවන රැකියා අවස්ථා ඇති කිරීම හා පසු අස්වනු තාක්ෂණ ක්‍රම ගොවි ජනතාව අතරට ගෙන යාම සඳහා නිසි වැඩ පිළිවෙලක් සැකසීම.

6 ප්‍රදේශයේ සම්පත් ප්‍රයෝජනයට ගනිමින් පශු සම්පත් සංවර්ධනය සඳහා නිසි වැඩ පිළිවෙලක අවශ්‍යතාවයද බොහෝ ගොවීන් විසින් මතු කරන ලදී.